# කාර්ය සාධන වාර්තාව - 2021

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන**
**රාජ්‍ය අමාත්‍යාංශය**

දෙවන මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල

# පිටු පෙළගැස්ම


| පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|
| පරිච්ඡේදය 1 | |
| 1.1 හැඳින්වීම | 2-3 |
| 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 4 |
| 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 5 |
| 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ | 6-7 |
| 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන් | 8-14 |
| 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සහ අරමුදල් | 15-18 |
| 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති | 19 |
| පරිච්ඡේදය 2- 2021 ප්‍රගතිය සහ 2022 ඉදිරි දැක්ම | 20-37 |
| පරිච්ඡේදය 3- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 38-44 |
| පරිච්ඡේදය 4 - කාර්ය සාධන දර්ශක | 45 |
| පරිච්ඡේදය 5 - තිරසර සංවර්ධන අරමුණු | 46 |
| පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ | 47-50 |
| පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව | 51-55 |

# 1.1 හැඳින්වීම

2019 නොවැම්බර් 16 වන දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව නව අමාත්‍යාංශ පිහිටුවීමත් සමග අංක 2158/41 හා 2020.01.17 දිනැති ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන, ජලසම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක විය.

ඉන් අනතුරුව 2020 අගෝස්තු 05 වන දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයත් සමග අමාත්‍යාංශ විෂයන් සංශෝධනය වූ අතර, 2020.08.09 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2187 /27 දරණ ගැසට්පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස දැනට ක්‍රියාත්මක වේ. එමගින් මෙතෙක් ක්‍රියාත්මකව පැවති නිවාස හා ඉදිකිරීම් විෂය පථයට අමතරව ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන විෂය මෙම අමාත්‍යාංශයට ඇතුළත් විය. මීට අමතරව 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව කැබිනට් අමාත්‍යාංශයක්ව පැවති පුනරුත්ථාපන, අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය ද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ඇත.

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන " රට හදන සෞභාග්‍යයේ දැක්ම " ප්‍රතිපත්ති රාමුව ක්‍රියත්මක කරමින් සැමට සුව පහසු නිවසක් ලබා දීමේ ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන කාර්යභාරය මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ සඳහා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටළුවට පිළියම් සෙවීමේ "ඔබට ගෙයක් රටට හෙටක් " නිවාස වැඩසටහන 2020 වර්ෂයේ දී නව අමාත්‍යාංශ පිහිටුවීමත් සමග ආරම්භ කර 2021 වසර තුළද අඛණ්ඩව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය.

මෙම වැඩසටහන යටතේ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුලකට රු. 600,000 ක ආධාර මුදලක් රජයේ ප්‍රදානයක් වශයෙන් සහ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් යුතුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ප්‍රතිලාභී පවුල විසින් නිවාස ඉදිකිරීම සිදු කරනු ලැබේ. මෙම වැඩසටහන මගින් 2021 වසර තුල දිවයින පුරා නිවාස 13,222 ඉදිකිරීම් ආරම්භ කළ අතර, ඉන් නිවාස 4,078 ක් අවසන් කර ප්‍රතිලාභීන් පදිංචි කරවීමට හැකි විය.

2021 වසර වෙනුවෙන් අමාත්‍යාංශයට රු.මි. 17,202 ක සංවර්ධන ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර පැවති කොවිඩ් 19 අවදානම් තත්වය මධ්‍යයේ වුවද ඉන් රු.මි. 12,955 වැය කර 75.9% ක් ප්‍රගතියක් ලගාකර ගැනීමට හැකි විය. " ඔබට ගෙයක් රටට හෙටක් වැඩසටහන " සඳහා 2021 වර්ෂය තුල රජය මගින් රු.ලක්ෂ 06ක ආධාර මුදලක් ලබා දීමට හැකි වූ අතර 2022 වර්ෂයේදී එම ආධාර මුදල රු.ලක්ෂ 6.50ක් දක්වා වැඩි කිරීමට හැකි වී ඇත.

තමාටම නිවසක් අලුතින් ගොඩනැගීමේ උනන්දුව හා හැකියාව ඇති මෙන්ම ඉදිකිරීම් ආරම්භ කර අතරමග නැවතී ඇති බාහිර මූල්‍යාධාරයන් බලාපොරොත්තු වන පවුල් වෙත සහනදායී පොලී අනුපාතයක් යටතේ නිවාස ණය ලබා දීමේ වැඩසටහන්ද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා වසර ගණනාවක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ වල මැදි ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලු වලට පිළියම් සෙවීම සඳහා දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි නිවාස 100 කින් සමන්විත නිවාස සංකීර්ණ ඉදිකිරීම වෙනුවෙන් ආරම්භ කල " සියපත මහල් නිවාස වැඩසටහන " සඳහා මුලපිරීමට හැකි වූ අතර එහි මුල් අදියර ලෙස පළාත් 9 තුළ එක් මහල් නිවාසයක් බැගින් ආරම්භක පියවර ලෙස මේ වන විට බස්නාහිර, සබරගමුව හා උතුරු මැද පළාත් ආවරණය වන පරිදි නිවාස සංකීර්ණ 03 ක වැඩ ආරම්භ කිරීමට හැකි වී ඇත.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේදී අවශ්‍ය වන පුහුණු ශ්‍රමිකයන්ගේ සහ වෘත්තිකයන්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පුහුණු වැඩසටහන් මගින් සෛද්ධාන්තික සහ ප්‍රායෝගික යන අංශ දෙකම සම්පූර්ණ වන අතර " සයනී " වැඩසටහන මගින් 2021 වසර තුල ශිල්පීන් 1000ක් පුහුණු කිරීම අපේක්ෂා කලද පැවති සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් පුහුණුව ලබා දීමට හැකි වූයේ අඩු ප්‍රමාණයකි.

" ශ්‍රම සිකුරු" වැඩසටහන මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පරිපූර්ණ තාක්ෂණික දැනුම සහිත පුහුණු ශ්‍රමිකයින් බිහිකිරීම සිදු කරන අතර 2021 වසර තුල මෙමගින් 2003 දෙනෙකු පුහුණුව සම්පූර්ණ කර ඉදිකිරීම් කර්මාන්ත වැඩබිම් සඳහා සම්බන්ධ කර ඇත.

ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ සඳහන් වන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී රාජ්‍ය අංශයට අයත් ව්‍යවස්ථාපිත ආයතන මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන අයුරින් පවත්වා ගෙන යාමට පසුගිය දෙවසර තිස්සේ ඉතා ඕනෑකමින් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට හැකි විය. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයද ස්වයං පැවැත්ම තහවුරු කර ගැනීමේ තත්වයට පත් වීම මෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවද ඉතා සාධනීය ලෙස තම පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පැවති ගැටුම් හේතුවෙන් අවතැන්වූවන් වෙනුවෙන් ක්‍රියාත්මක වූ නැවත පදිංචි කිරීමේ අංශයද මෙම අමාත්‍යාංශයට එක් වීම මගින් අමාත්‍යාංශයේ විෂය පථය තවදුරටත් පුළුල් විය.

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතට පත් කෙරිණි. මෙම අංශය මගින් උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන,

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ඕෂන් වීව් සංවර්ධන (පුද්.) සමාගම
- මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් වැඩසටහන
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
- සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

## 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

### දැක්ම

" සැමට නිවාස හා තිරසර ඉදිකිරීම් "

### මෙහෙවර

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන යන අංශවලට ජාතික නායකත්වය සැපයීම; ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයන් නියාමනය කිරීම; මූල්‍යකරණය, පහසුකම් සැපයීම සහ උපදේශනය තුලින් ජාතික නිවාස වැඩසටහනට සහාය වීම; මූල්‍ය, තාක්ෂණික, උපදේශන, යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය අංශයන්ගෙන් ඉදිකිරීම් කර්මාන්තයට සහාය වීම; සහ රාජ්‍ය ආයතන සඳහා ඉදිකිරීම් සේවා, අවකාශය හා ගොඩනැගිලි නඩත්තු සේවා සැපයීම මෙම අමාත්‍යංශයේ මෙහෙවර වේ.

### අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාළ ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

## 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

### නිවාස හා සංවර්ධන අංශය

1. නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, අණ පනත්, රෙගුලාසි, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අඩු ආදායම්ලාභීන්, මධ්‍ය ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම, නිවාස මුල්‍යාධාර හා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, හා මහජනතාව විසින් සිදුකරන නිවාස ඉල්ලීම් සම්බන්ධ කටයුතු කිරීම.
3. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් හඳුනාගැනීම අත්පත් කර ගැනීම, පවරා ගැනීම, බැහැර කිරීම හා ඔප්පු නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.

### තාක්ෂණ අංශය

1. ඉදිකිරීම් විෂයට අදාලව ප්‍රතිපත්ති නීතිරීති සම්පාදනය හා පසු විපරම් කිරීම.
2. ඉදිකිරීම් කර්මාන්තය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. අමාත්‍යාංශය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි කටයුතු නියාමනය හා මගපෙන්වීම.
4. රජයේ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු වල කාර්යයන් ඉටු කිරීම.

### ඉදිකිරීම් අංශය

1. අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන සම්බන්ධිකරණය සහ ප්‍රගතිය නියාමනය කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණිකමය නොවන ආයතන සඳහා ඉදිකිරීම් කටයුතු වලදී තාක්ෂණික මගපෙන්වීම් ලබාදීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රයන් අදාල විදේශීය වෘත්තිකයන් සහ පුහුණු වෘත්තිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම.

### අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය

1. අවතැන්වූ පවුල් සඳහා ග්‍රාමීය නිවාස ඉදි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබාදීම.
2. බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

# 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ

## සංවිධාන ව්‍යුහය




ගණකාධිකාරී -ගණ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නි. අ.
සහකාර ලේකම් - ස.ලේ

සහකාර අධ්‍යක්ෂ -ස.අ
නීති නිලධාරී - නී.නි
පරිපාලන නිලධාරී - ප.නි

භාෂා පරිවර්තක නිලධාරී -භා.පරි.
තොරතුරු තාක්ෂණ නිලධාරී -තො.තා.නි
සංවර්ධන නිලධාරී - සං.නි

තාක්ෂණ නිලධාරී- තා.නි
ප්‍රමාණ සමීක්ෂක - ප්‍ර.ස
රාජ්‍ය කළමනාකරණ නිලධාරී - රා.කළ.නි

ඡායාරූප ශිල්පී - ඡා.ශි
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස
වීඩියෝ ඡායාරූප ශිල්පී - ඡා.ශී

සහකාර ඡායාරූප ශිල්පී- ස.ඡා.ශී
රියදුරු -රි

# 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ




ගණකාධිකාරී -ගණ
සහකාර අධ්‍යක්ෂ - ස.අ
පරිපාලන නිලධාරී - ප.නි
කැමරා ක්‍රියාකරු - කැ.ක
වීඩියෝ ඡායාරූප ශිල්පී - ඡා.ශි
රියදුරු -රි
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නි. අ.
ඡායාරූප ශිල්පී - ඡා.ශි
භාෂා පරිවර්තක නිලධාරී - භා.පරි.
සංවර්ධන නිලධාරී - සං.නි
කළමනාකරණ සේවා නිලධාරී- ක.සේ.නි
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස
සහකාර ලේකම් - ස.ලේ
නීති නිලධාරී - නි.නි
තොරතුරු තාක්ෂණ නිලධාරී -තො.තා.නි
තාක්ෂණ නිලධාරී- තා.නි
සහකාර ඡාරූප ශිල්පී - ස.ඡා.ශි

# 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන්

## 1.5.1 පාලන අංශය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් හා මානව සම්පත් කළමනාකරණය පාලන අංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව ඊට අවශ්‍ය වන පසුබිම සකස් කිරීම, භෞතික හා මානව සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල සියලුම ආයතනික කටයුතු හා මානව සම්පත් කළමනාකරණය සඳහා මගපෙන්වීම පාලන අංශයෙන් සිදු කරනු ලබයි.

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු හා සියලුම නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
2. අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
3. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම ආයතනික හා පරිපාලන කටයුතු කිරීම.
4. අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණයට අදාලව මු.රෙ.135 යටතේ පාලන අංශයේ නිලධාරීන් වෙත පවරන ලද බලතල ප්‍රකාරව කටයුතු කිරීම.
5. පාලන අංශයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම.
6. පාර්ලිමේන්තුව සම්බන්ධ අදාල කටයුතු සම්බන්ධීකරණය.
7. මානව සම්පත් සංවර්ධනයට අදාල දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු කිරීම.
8. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වල වාර්ෂික වාර්තා, කාර්යසාධන වාර්තා පිළිබඳ සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
9. රැස්වීම් හා විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම.
10. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණයට අදාල ක්‍රමවේද වැඩිදියුණු කිරීම සම්බන්ධීකරණ කටයුතු කිරීම.
11. ස්ථාවර වත්කම් කළමනාකරණය හා නඩත්තු කටයුතු කිරීම.

## 1.5.2 සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම් කළ පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ. නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ මෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සිදු වූ ගැටුම් වලින් අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ කටයුතු සහ යටිතල පහසුකම් සැපයීමේ කටයුතු වලදී සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීමද ඊට අයත්ය. තවද, සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය සාක්ෂාත් කර ගනිමින් නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් ඉලක්ක කරා මෙහෙයවීමේ කටයුතු පසු විපරම් කිරීම හා ඇගයීම් සිදු කිරීමත් සැලසුම් අංශය මගින් සිදු කෙරේ.

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අනුගත වෙමින් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.

2. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වලින් ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් ඇගයීමෙන් අනතුරුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
3. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
4. ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.
5. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මාසිකව, කාර්තුමය වශයෙන් හා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට අනුව වාර්තා කිරීම හා ඇගයීම.
6. අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාල අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම. පිළිබඳව පසුවිපරම් කිරීම.
7. අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
8. කාර්යය සාධන වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
9. ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම, වාර්තා සකස් කිරීම හා පසුවිපරම් කිරීම.
10. විදේශාධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීම හා පසුවිපරම් කිරීම.

## 1.5.3 නිවාස හා සංවර්ධන අංශය

### 1.5.3.1 නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලගා කර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මගපෙන්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්**

**1. ප්‍රතිපත්ති සම්පාදනය**

- නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
- නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම.
- නිවාස ක්ෂේත්‍රයට අදාල පනත් සංශෝධනය හා රෙගුලාසි සම්පාදනය.
- නිවාස ක්ෂේත්‍රයට අදාල වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමග සහ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.
- වෙනත් අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිවාස අංශයට අදාල නිරීක්ෂණය සකස් කර ඉදිරිපත් කිරීම.
- ගරු මැති ඇමතිවරුන් විසින් ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන පාර්ලිමේන්තු ප්‍රශ්ණ සඳහා පිළිතුරු හා නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.

**2. නිවාස සංවර්ධනය**

- අඩු ආදායම්ලාභී ජනතාව සඳහා දීප ව්‍යාප්තව " ඔබට ගෙයක්-රටට හෙටක් " නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මැදි ආදායම්ලාභී පවුල් සඳහා "සපිරි මහල් නිවාස" වැඩසටහන, " සියපත නිවාස වැඩසටහන" හා ප්‍රධාන වශයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ මහල් නිවාස ඉදිකිරීමේ " මධ්‍ය ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන" නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ගේ පදිංචියට සුදුසු නිවසක් නොමැති මා පිය පවුල් වෙත නිවාස ලබා දීමේ " මිහිදු නිවහන" වැඩසටහන.
- නිවසක් ඉඩමක් නොමැති ප්‍රධාන වශයෙන් කුලී පදනම මත ජීවත් වන මහජනතාව සඳහා " සොදුරු මහල් නිවාස වැඩසටහන " ක්‍රියාත්මක කිරීම.

- සහභාගිත්ව ක්‍රමවේදය යටතේ නිවාස ණය / ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත සංවර්ධනය කිරීම සම්බන්ධ කටයුතු.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමඟ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කටයුතු.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහජනතාවගෙන් ඉදිරිපත් වන නිවාස ඉල්ලීම් අදාල ආයතන වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණය.

**3. වෙනත් රාජකාරි**

- ලෝක ජනාවාස දිනයට සමගාමීව නිවාස විෂය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සමග සිදුකරන අනෙකුත් සම්බන්කධීරණ කටයුතු සිදු කිරීම හා තොරතුරු වාර්තා සකස් කර යොමු කිරීම.

## 1.5.3.2 ඉඩම් අංශය

නිවාස වැඩසටහන් සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම, අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය සිදුකරමින් ඉඩම් අත්පත් කරගැනීම් සහ බැහැර කිරීමේ කාර්යයන් වේගවත් කිරීම, ඉඩම් විෂය සම්බන්ධව ඉදිරිපත් වන ගැටළු සහ ඉල්ලීම් සම්බන්ධ කටයුතු කිරීම මෙම අංශය මඟින් සිදුකරයි. තවද, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අවශ්‍ය ඉඩම් පවරා ගැනීම හා සම්බන්ධීකරණය කිරීම.

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8(1) වගන්තිය අනුව අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක්, මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් අන්සතු කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතුවේ. ඒ යටතේ, මුදල් ගෙවා අවසන් කළ නිවාස/ ඉඩම්ලාභීන්ට ඔප්පු නිකුත් කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සකස් කර එවනු ලබන ලේඛනවලට අනුමැතිය ලබාගෙන නැවත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීම සිදු කෙරේ.

**ඉඩම් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම /පවරා ගැනීම සම්බන්ධ කටයුතු.
2. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.
3. ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට පවරා දීම.
4. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය යන ආයතන වලට අවශ්‍ය ඉඩම් පවරාගැනීම පිළිබඳ කටයුතු.

**මැදි ආදායම් ව්‍යාපෘති ඒකකය**

නාගරිකව හා උප නාගරිකව වෙසෙන මැදි ආදායම් ලාභීන් උදෙසා නිවාස ලබාදීමේ වැඩසටහනක් " මධ්‍ය ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන " නමින් ආරම්භ කර ඇත. එම වැඩසටහන යටතේ නාගරික හා උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව සහන මිලකට මැදි ආදායම්ලාභීන් උදෙසා සියළු පහසුකම් වලින් සපිරි මහල් නිවාස සාධාරණ මිලකට ලබාදීම සිදු කෙරේ. මෙහිදී ආයෝජනය, සැලසුම් කිරීම, ඉදිකිරීම, අලෙවිකරණය හා විකිණීම පුද්ගලික අංශය විසින් සිදුකල යුතු අතර රජය විසින් නිවාස ව්‍යාපෘතියේ ප්‍රවේශය දක්වා ජලය, විදුලිය හා මාර්ග පහසුකම් ලබාදීමත් නිවාස ව්‍යාපෘති ඉදිකරන ඉඩමේ සංවර්ධන මිල පමණක් අයකර ගනිමින් ව්‍යාපෘතිය සඳහා ඉඩම් ලබා දීමත් සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, " මැදි ආදායම් ව්‍යාපෘති ඒකකය" නමින් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති කළමනාකරණ ඒකකයේ කාර්යන් වේ.

### 1.5.3.3 ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුළී පනත යටතේ පැවරී ඇති යම් කාර්යයන් ද ඉටු කරයි.

**ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. කුළී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම.
2. රජයට පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
3. පොදු පහසුකම් සඳහා වෙන්කොට ඇති කොටස් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු නිරාකරණය කිරීම.

### 1.5.4 තාක්ෂණ අංශය

අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කටයුතු සඳහා සහයෝගය සම්බන්ධීකරණය හා තාක්ෂණික මගපෙන්වීම සිදු කරනු ලැබේ. ඒ අනුව, ප්‍රගති සමාලෝචන රැස්වීම් අමාත්‍යාංශය තුළ සිදු කෙරේ.

මූලික වශයෙන් මෙම අමාත්‍යාංශය ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීමට, ගුණාත්මක හා පරිසර හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් බිහි කිරීමට ඇති ආයතන මෙහෙයවීම සිදු කෙරේ. ඒ සඳහා මූලිකවම මැදිහත් වන්නේ තාක්ෂණ අංශයයි.

**තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පනත් කෙටුම්පත් සහ පනත් සම්බන්ධ කටයුතු කිරීම.
3. තාක්ෂණ අංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තය නියාමනය සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
4. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සුදානම් කිරීම සඳහා කටයුතු කිරීම.
5. වෘත්තියවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

### 1.5.5 ඉදිකිරීම් අංශය

2019.05.29 වන දින අතිරේක ලේකම්වරයකු පත් කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් අංශය ස්ථාපිත විය.

මූලික වශයෙන් සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු අමාත්‍යංශ මට්ටමින් සම්බන්ධිකරණ කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

**ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. අදාල ආයතන වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
2. අදාල ආයතනවල මූල්‍යමය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අධීක්ෂණය කිරීම හා උපදේශන සේවා සැපයීම.
4. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධීකරණ කිරීම.
5. අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
6. නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා විසා බලපත්‍රයක් ලබා ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.

### 1.5.6 ඉංජිනේරු සේවා අංශය

2021.07.01 වන දින අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු සේවා අංශය ස්ථාපිත විය.

මූලික වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු හා යන්ත්‍රෝපකරණ සේවා සැපයීම සම්බන්ධයෙන් අමාත්‍යංශ මට්ටමින් සම්බන්ධීකරණ කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

#### ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අදාල ආයතන වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
2. අදාල ආයතනවල මූල්‍යමය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
3. ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සේවා සැපයීම සම්බන්ධව අධීක්ෂණය කිරීම හා උපදේශන සේවා සැපයීම.
4. සේවක ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම් හා ඒ සම්බන්ධ කටයුතු සොයා බැලීම් සිදුකිරීම.
5. අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා නිරීක්ෂණ කටයුතු සිදුකිරීම.

### 1.5.7 මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

#### මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

1. කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
3. මූල්‍ය කළමනාකරණ, මූල්‍ය සැලසුම්, අයවැයකරණය, වත්කම් කළමනාකරණය හා මිලදී ගැනීම්, කළමනාකරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශයට හා යටතේ ඇති ආයතන සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම.
4. මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගත හැකි ආකාරයට මූල්‍ය සම්පත් භාණ්ඩාගාරයෙන් ලබාගෙන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අතර බෙදා හැරීම.
5. අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කිරීම පෙරදැරිකොට එම ආයතන සමඟ සාමූහිකව වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම හා වර්ෂය පුරා අයවැය පාලන කටයුතු කිරීම.
6. වාර්ෂික විසර්ජන පනත මගින් අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට වෙන් කරන මුදල් වියදම් කිරීමේදී නියමිත පරිදි වාර්තා කිරීම හා මාසිකව, වාර්ෂිකව මූල්‍ය වාර්තා අදාල ආයතන වලට ඉදිරිපත් කිරීම.
7. රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් එම අංශ මගින් යෝජනා කරන අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.
8. අමාත්‍යාංශයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කිරීම.

### 1.5.8 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කරගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම.
අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගි වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මඟ පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් සහායවීම.

## අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම.
2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.
3. විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවම කර ගැනීමට සහාය වීම.
4. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම.

## 1.5.9 නැවත පදිංචි කිරීමේ අංශය

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතට පත් කෙරිණි. නැවත පදිංචි කිරීමේ අංශය මගින් උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව මෙම අංශය මගින් 2021 වසර තුල උතුරු පළාතේ පවුල් 2666 කට අයත් පුද්ගලයින් 7337 ක්ද නැගෙනහිර පළාතේ පවුල් 19 කට අයත් පුද්ගලයින් 54 ක් මුල් ගම් බිම් වල හෝ විකල්ප ස්ථාන වල නැවත පදිංචි කිරීම සිදු කර ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ අනුව 2021 වර්ෂය තුල පවුල් 2685 කට අයත් පුද්ගලයින් 7391 ක් දෙනෙක් නැවත පදිංචි කිරීම අවසන් කර ඇත.

මෙයට අමතරව පවුල් 2909 කට අයත් පුද්ගලයින් 8767 ක් නැවත පදිංචි කිරීමට නියමිතව ඇත. ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන්ව ඉන්දියාව බලා පිටත් වූ පවුල් අතුරෙන් නැවත ලංකාවට පැමිණි පවුල් ඔවුන්ගේ මුල් ගම්බිම් වල නැවත පදිංචි කිරීම ද මෙම අංශය මගින් සිදු කරනු ලබයි. එහිදී මොවුන්ට අවශ්‍ය නිවාස සහ අනෙකුත් මූලික යටිතල පහසුකම් ලබා දීම ද සිදු කරනු ලබයි.

තවද මෙම අංශය මගින් උතුරු හා නැගෙනහිර පළාත් වල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාව හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ (මයින්ස් ඇඩ්වයිසරි ගෲප් ආයතනය, හලෝ ට්‍රස්ට් ආයතනය, ඩ්වෝන් ඇසිස්ටන්ස් ෆෝ ෂෝෂල් හාර්මනි ආයතනය, ස්කව්තා හියුමනිටේරියන් ඇසිස්ටන්ස් ඇන්ඩ් රිලයිෆ් ප්‍රොජෙක්ට් ආයතනය) එක්ව සිදුකොට අවදානම් සහිත වූ ඉඩම් නැවත මුල් අයිතිකරුවන් ගේ අයිතියට පත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරනු ලබයි.

2021 වසර තුල වර්ග කි.මී. 4.3 ප්‍රමාණයක් බිම් වෙඩි ඉවත් කොට නැවත පදිංචි කිරීම් හා සංවර්ධන කටයුතු සඳහා නිදහස් කොට ඇත. මෙයට අමතරව කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වල වර්ග කි.මී. 13.5 ක ප්‍රමාණයක් තව දුරටත් බිම් වෙඩි ඉවත් කිරීමට ඉතිරිව ඇත.

ගැටුම්කාරී වතාවරණය හේතුවෙන් අවතැන්ව තම මුල් ගම්බිම් වල පදිංචි පවුල් සඳහා පෙර නිමි කොන්ක්‍රීට් පැනල් නිවාස ඉදි කිරීම වෙනුවෙන් රු.මි 400ක ප්‍රතිපාදන නිවාස ඒකක 300ක් සඳහා 2021 වර්ෂයේදි වෙන් කර තිබුනි. ඒ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිවාස ඒකක 150ක් ද මඩකලපුව දිස්ත්‍රික්කයේ 100ක්ද අම්පාර දිස්ත්‍රික්කයේ නිවාස ඒකක 50ක් ලෙස මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබූ අතර ඉන් බොහොමයක ඉදිකිරීම් ආරම්භ කර නිවාස 12ක ඉදිකිරීම් කටයුතු 2021 වසර තුල සම්පූර්ණයෙන් අවසන් කිරීමට හැක විය. මේ සඳහා 2020 වසර තුල රු.මි 72.80 ක් සහ 2021 වසර තුල රු.මි 2.87 ක් ලෙස රු.මි 75.67ක් මේ වන විට වැය කර ඇත.

## නැවත පදිංචි කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. උතුරු නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම.

2. ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි සුභසාධන මධ්‍යස්ථාන වල වාසය කරන ඉඩම් අහිමි පවුල් සඳහා රාජ්‍ය ආධාර මත ඉඩම් මිල දී ගෙන ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබා දීම.

- පානීය ජල පහසුකම් ලබා දීම.
- ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබා දීම.
- හානියට පත් නිවාස අළුත්වැඩියා කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් ලබා දීම.
- අවතැන් වූ පවුල් වාසය කරන ප්‍රදේශ වල අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම.
- හානියට පත් පාසල් ගොඩනැගිලි හා පෙර පාසල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම.

4. බිම් වෙඩි හා පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මෙහෙයවමින් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු හා සංවර්ධන කටයුතු සඳහා ඉඩම් නිදහස් කිරීම.

5. නැවත පදිංචි කිරීමේ කටයුතු වලට පහසුකම් සපයන දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම.

6. අවතැන් වූ ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා ජීවනෝපාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන හා ව්‍යාපෘති ඒකක

## 1.6.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත මඟින් ස්ථාපිත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් බවට පත්කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජීවත් වන සෑම පුරවැසියකුම සුවපහසු නිවසක සතුටින් ජීවත්වීම තහවුරු කිරීම සඳහා පහසුකම් සැලසීම,උනන්දු කරලීම හා සම්බන්ධීකරණය කිරීම සිදුකරනු ලබයි.අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතාවය ඉටුකිරීමට " ඔබට ගෙයක් රටට හෙටක් " වැඩසටහන ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇති අතර මධ්‍ය ආදායම්ලාභීන් සඳහා දැරිය හැකි මිලකට නිවසක් ලබාදීම සඳහ සියපත/සපිරි මහල් නිවාස වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. 2164 ක් පමණ වන අනුමත කාර්යය මණ්ඩලයක් සහිත ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් 2000ක් පමණ වූ සත්‍ය කාර්ය මණ්ඩලයක් සමඟින් එහි කටයුතු කොළඹ-02 පිහිටි ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි ස්ථාපිත දිස්ත්‍රික් කාර්යාල 25ක් හා කොළඹ නගර කාර්යාල 2කට අමතරව තවත් උප කාර්යාල 8ක් මඟින් එහි සේවාවන් ජනතාවට වඩාත් පහසුවෙන් ලබා ගත හැකි වන පරිදි විමධ්‍යගත කර ඇත.

## 1.6.2 ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම

ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරියෙහි කොටස් ප්‍රාග්ධනයෙන් සමන්විතව 1994 වර්ෂයේ ජුලි 13 වන දින 1982/17 දරණ පනතින් සංස්ථාපනය කරන ලදුව පසුව 2007/7 දරන නව සමාගම් පනත යටතේ ලි.ප.අංක - පීවී 17667 මඟින් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

රාජ්‍ය සමාගමක් ලෙස දේපල සංවර්ධනය හා දේපල කළමණාකරනයෙහි විශිෂ්ඨත්වයට පත්, රාජ්‍ය ආයතනයක් ලෙස විශ්වාසනීය, පුද්ගලික සමාගමක් ලෙස කාර්යක්ෂමතාවය පදනම් කොටගෙන පාරිභෝගිකයා වෙත කඩිනම්, තත්වයෙන් උසස්, ප්‍රමිතියානුකුල සේවාවක් සැපයීම හා පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයට සරිලන පරිදි තනි නිවාස මෙන්ම නිවාස ව්‍යාපෘති ඉදිකොට වෙළෙඳපල තරගකාරීත්වය මත පදනම් වූ හා සාධාරණ මිලකට අලෙවි කිරීම සිදු කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලැබේ.

## 1.6.3 මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් වැඩසටහන

2016 වර්ෂයේදී හඳුන්වාදෙන ලද මෙම වැඩසටහන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා සියළු පහසුකම් වලින් සපිරි නිවසක් උරුමකර දීමේ අරමුණින් යුතුව ආරම්භ කර ඇති මධ්‍ය ආදායම්ලාභී පවුල් වලට පහසුකම් සැලසීම හා සම්බන්ධිකරණය කිරීම මගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම මෙන්ම ආර්ථික සමෘද්ධිය ලගාකරදීම මෙමගින් සිදු කරනු ලබයි.

## 1.6.4 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1849 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලෙසින් ආරම්භ වු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී " ඒ " කාණ්ඩයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබු අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් අනතුරුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එකම අධිකාරි ආයතනය සහ උපදේශක ආයතනය ලෙස සළකනු ලැබේ.

ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 07 ක් මගින් දිවයින පුරා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මගින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් වස් විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබේ.

මෙම ආයතනය ISO 9001/2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.

## 1.6.5 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 1849 වර්ෂයේ එවකට පැවති බ්‍රිතාන්‍ය පාලනය විසින් කොළඹ ගෑස්පහ හංදියේදී ආරම්භ කර ඇත. 1928 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික වැඩපල වශයෙන් දැනට පවතින කොලොන්නාව භූමියේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ සියළුම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ස්ථාපිත කරන ලදි. 1971 වර්ෂයේදී " ඒ " ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පත් කර ඇත.

දැනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ජල පාලන දිය දොරටු සාදා සැපයීම, සවි කිරීම හා නඩත්තුව, තැපැල් දෙපාර්තමේන්තුවේ දින මුද්‍රා හා දින කැට සාදා සැපයීම, පොලිස් දෙපාර්තමේන්තුවේ අංක තහඩු සහ සාජන් පටි සෑදීම, දැවමය ගෘහ භාණ්ඩ සාදා සැපයීම, ජල සම්පාදන මණ්ඩලයේ ජලය පිරිපහදු ටැංකි සෑදීම, රාජ්‍ය උත්සව සඳහා පිලිගැනීමේ පීඨිකා සවි කිරීම, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යකඩ පාලම් සාදා සවිකිරීම, ආයතන වල කාමර වෙන් කිරීම (Aluminium Partition) සහ නාම පුවරු සාදා සවි කිරීම, රාජ්‍ය ආයතනවල වාහන සේවා හා නඩත්තු කිරීම, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත වීනචට්ටි, තිරිංග පලු ඇතුළු වීනචට්ටියෙන් නිම කරන ලද භාණ්ඩ සාදා සැපයීම, දැවමයෙන් හා යකඩයෙන් නිම කරන ලද රෝහල් උපකරණ සාදා සැපයීම, බොයිලේරු සහ ගෑස්නල පද්ධති නඩත්තු කටයුතු සිදු කිරීම. තාක්ෂණික සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ ඉංජිනේරු සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීම ආදී කටයුතු සිදුකරනු ලබයි.

අප ආයතනය ISO 9001 /2015 තත්ත්ව සහතිකය ලබාගෙන ඇත.

## 1.6.6 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් සඳහා අධිකාරිය කටයුතු කරනු ලැබේ.

## 1.6.7 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශක සේවා ලබාදීම, ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය, පෙරසවි/පෙරැදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබාදීම මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු ද සිදු කරනු ලබයි.

2009 වසරේ සිට ISO 9001/2000 තත්ත්ව සහතිකයෙන් හා ISO 14001/2004 පරිසර කළමනාකරණ සහතිකයෙන්ද පිදුම් ලබා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

## 1.6.8 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

රාජ්‍ය ආයතන වලට යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 වසරේ දී පිහිටුවන ලදි. 2011 වසරේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශය ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඒ යටතට ගනු ලැබූ අතර 2016 වසරේ ජනවාරි මාසයේ දී නැවත වරක් අමාත්‍යමණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේම කළමනාකරණ මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ.

වනජීවී, සත්වෝද්‍යාන, වාරිමාර්ග, වෙරළ සංරක්ෂණ සහ දුම්රිය ආදී දෙපාර්තමේන්තු විසින් ප්‍රදානය කරනු ලබන විශේෂිත කොන්ත්‍රාත් මගින් මෙම ආයතනය ඉදිරියට යමින් සිටියි. මුද්‍රණ වෘත්තිකයින්, පුහුණු සේවකයන් සහ කම්කරු මට්ටමේ සේවකයන්ගෙන් සැදුම්ලත් කාර්යය මණ්ඩලයකින් සමන්විතය. තවද ආයතනය බර යන්ත්‍රෝපකරණ ඇණියක් සහ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා සේවය සපයන ඩිපෝ පද්ධතියකින් මෙන්ම දිවයිනේ සෑම පළාතකම පිහිටි සියළු පහසුකම් වලින් සමන්විත යාන්ත්‍රික වැඩහල් වලින් යුක්තය.

## 1.6.9 සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා සමාගම

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කරන ලදි. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ 100% රජය සතු සී/ස වගකීම් සහිත සමාගමක් බවට මෙම සංස්ථාව පත්කරන ලදි. 2007 වර්ෂයේදී සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් විය. නැවත 2010 වර්ෂයේ මාර්තු මාසයේදී 2007 සමාගම් පනතේ අංක 07 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

බාහිර ශාඛා 16 කින් සමන්විතව දීප ව්‍යාප්තව ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ඉහල ප්‍රමිතියකින් හා මිල නියාමනයකින් යුක්තව පාරිභෝගිකයන්ට සැපයීමට සහ එකම වහලක් යට සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ විවිධ සැපයුම්කරුවන් අතරින් තෝරාගෙන පාරිභෝගිකයන්ට මිලදී ගැනීමට අවකාශයක් ලබා දී තිබීම මෙමගින් සිදු කරනු ලැබේ.

## 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස සංවර්ධන ව්‍යාපෘති 5 ක් මෙම අමාත්‍යාංශය යටතේ පවතී.

| ව්‍යාපෘතිය | මුල්‍ය වටිනාකම | ව්‍යාපෘති කාලසීමාව | ව්‍යාපෘති අරමුණු |
|---|---|---|---|
| පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය (මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 1. ඉන්දියානු රජය රු.මි.300<br>2. ශ්‍රී ලංකා රජය රු.මි.195 | 2018-2019 ( කොන්ත්‍රාත් සමාගමේ ගැටලුවක් හේතුවෙන් නවතා තිබී මෙම වර්ෂයේ CECB ආයතන වෙත කොන්ත්‍රාත්තුව ලබා දී නැවත ආරම්භ කර ඇත ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම ග්‍රාම නිලධාරි වසමේ දිළිදු පවුල් 153 සඳහා නිවාස සැපයීම ඇතුළු මූලික සමාජ යටිතල පහසුකම් සැපයීම |
| දීප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2017-2020 (ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර ඇත ) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| හම්බන්තොට දිස්ත්‍රික් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2017-2020 (ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර ඇත ) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2018-2021 (ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර ඇත ) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2018-2021 (ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර ඇත ) | දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |

# පරිච්ඡේදය 2

## 2021 ප්‍රගතිය සහ 2022 ඉදිරි දැක්ම (අංශ අනුව)

### 2.1 - පාලන අංශය

### 2021 ප්‍රගතිය

❖ **පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය**

මෙම අංශයට අදාළ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු කටයුතු, එනම් වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම, සේවය ස්ථිර කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම්, වැඩ බැලීම සඳහා පත් කිරීම හා රාජ්‍ය සේවයේ විශ්‍රාම ගැන්වීම යන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

❖ **මූල්‍ය කළමනාකරණය**

අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් රෙගුලාසි 135 යටතේ පවරන ලද බලතල ප්‍රකාරව පාලන අංශය වෙත ලැබෙන සියලුම වියදම් එනම් ගෙවීම් වවුචර් , ආපදා ණය / විශේෂ අත්තිකාරම් ඉල්ලීම් අදාළ ගෙවීම් වල නිරවද්‍ය බව පරීක්ෂා කර බලා අනුමැතිය හා නිර්දේශ ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ**

2021 වර්ෂයේ අනෙකුත් අංශ වලින් ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 22 ක් හා පාලන අංශයට අදාළව සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා සම්බන්ධීකරණය සිදු කළ අතර, අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ 91ක් අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇත.එමෙන්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු වූ පාර්ලිමේන්තු ප්‍රශ්න 11 ක් සඳහා පිළිතුරු යොමු කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කර නියමිත පරිදි පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

❖ **අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කාර්ය සාධන වාර්තා, වාර්ෂික වාර්තා -2021**

| විස්තරය | වාර්ෂික වාර්තා/කාර්ය සාධන වාර්තා |
|---|---|
| පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කර ඇති වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වාර්තා | • ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 2019 හා 2020 වාර්ෂික වාර්තාව<br>• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2017 හා 2018 කාර්යසාධන වාර්තාව<br>• ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2017 කාර්ය සාධන වාර්තාව |
| පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති වාර්ෂික වාර්තා සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති කාර්ය සාධන වාර්තා | • රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 2020 වාර්ෂික වාර්තාව<br>• රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 2016 හා 2017 කාර්යසාධන වාර්තාව |
| පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වර්තා | • ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2019 හා 2020 කාර්ය සාධන වාර්තාව<br>• ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2018 හා 2019 කාර්යසාධන වාර්තාව |

### ❖ ස්ථාවර වත්කම් කළමනාකරණය

නිවාස සහ ඉදිකිරීම් අංශයේ වාහන 43ක් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කර ඇති අතර, ඒ සඳහා රු.10,558,466.00 මුදලක් දරා ඇත.

අමාත්‍යාංශයේ වායු සමීකරණ යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර,මුද්‍රණ හා ෆැක්ස් යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, මෘදුකාංග, අභ්‍යන්තර දුරකථන පද්ධති, ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහාත් 2021 වර්ෂයේදී රු.4,819,917.36 මුදලක් වැය කර ඇත.

### නැවත පදිංචි කිරීමේ අංශය

නැවත පදිංචි කිරීමේ අංශයේ වාහන 15 ක් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කර ඇති අතර, ඒ සඳහා රු.4,805,840.72 මුදලක් දරා ඇත.

නැවත පදිංචි කිරීමේ අංශයේ යන්ත්‍ර උපකරණ හා ,ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහා 2021 වර්ෂයේදී රු.7,11,072.29 ක මුදලක් වැය කර ඇත.

### ❖ පුහුණු වැඩසටහන් පැවැත්වීම

නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා නිවාස හා ඉදිකිරීම් අංශයේ නිලධාරීන් 56 දෙනෙකු හා නැවත පදිංචි කිරීමේ අංශයේ නිලධාරීන් 62 ක් සඳහා 2021 වර්ෂය තුල පුහුණු අවස්ථා ලබා දී ඇත. එය පිළිවෙලින් එක් එක් අංශයන්හි සමස්ථ සේවක සංඛ්‍යාවෙන් 40% හා 50% ක ප්‍රතිශතයකි. පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තිය හමුවේ වුවද මාර්ගගත ක්‍රමය ඔස්සේ නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබා දී ඇති අතර, මාර්ගගත ක්‍රමවේදය හරහා නිවාස හා ඉදිකිරීම් අංශයේ මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකු සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබා දී ඇති අතර, දේශීය පුහුණු අවස්ථා ලබාදුන් නිවාස හා ඉදිකිරීම් අංශයේ 51ක් හා නැවත පදිංචි කිරීමේ අංශයේ 62 ක් සමඟ මුළු සේවක සංඛ්‍යාව 113 කි. කොවිඩ් වසංගත ව්‍යාප්තිය හමුවේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව සෑම නිලධාරියෙකුටම පැය 12 ක පුහුණු අවස්ථාවක් ලබාදීම සිදු කළ නොහැකි වූ අතර, පුහුණු අවස්ථා ඉල්ලුම් කල සෑම නිලධාරියෙකුටම කුමන හෝ එක් පුහුණු අවස්ථාවක් ලබාදීමට කටයුතු කර ඇත.

### ❖ මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

2021 වර්ෂයට අදාළව ජනාධිපති කාර්යාලයෙන් හා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් මෙම අංශයේ පාලන අංශයට මහජන ඉල්ලීම් ලිපි 10,000 ට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇත, ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ඉල්ලීම් සම්බන්ධයෙන් වන අතර එවැනි මහජන ඉල්ලීම් නිවාස අංශයට යොමු කර ඇත. තව ද සේවක සේවිකාවන්ගේ ආයතනික ගැටළු සහ වෘත්තීය ගැටළු සම්බන්ධව ලිපි 46 ක් ලැබී ඇති අතර එම ලිපි සෘජුවම අදාළ ආයතනය වෙත යොමු කරන අතර ලැබෙන පිළිතුර අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. දේශපාලන පලිගැනීම් සම්බන්ධව 2021 වර්ෂයට අදාළව ලිපි 13 ක් ලැබී ඇති අතර එම ලිපි සම්බන්ධවද අදාළ ආයතනවලින් විමසීම් සිදුකර ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇත. ඉහත මහජන ඉල්ලීම් සඳහා නොපමාව කටයුතු කරනු ලබන අතර ආයතනික හා වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට කටයුතු කරනු ලබයි.

### ❖ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සමපත් කළමනාකරණය

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කළමනාකරණය සඳහා පහත සඳහන් පරිදි සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ (PL කාණ්ඩයේ ) අත්‍යවශ්‍ය තනතුරු 77ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

- අමාත්‍යාංශයේ නිර්දේශ සමඟ යොමු කරන ලද, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පරිපාටි 04 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පැවති අත්‍යවශ්‍ය තනතුරු 44 ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය දී ඇත.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ජාතික උපදේශක සභාව සඳහා නව සාමාජිකයන් පත් කිරීමට කටයුතු කර ඇත.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා නව සභාපතිවරයා පත් කිරීමට පියවර ගෙන ඇත.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය සඳහා යොමු කර ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දි ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියේ පැවති ගැටළුකාරී තත්වයන් නිරවුල් කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- මැදි ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන් ව්‍යාපෘතිය සඳහා වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකු බඳවාගත් අතර, වැඩසටහන් ගණකාධිකාරී හා නියෝජ්‍ය අධ්‍යක්ෂ යන තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.
- සීමාසහිත ලංකා ගෙඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් සඳහා අනුමැතිය ලබා ගන්නා තෙක් කොන්ත්‍රාත් පදනම මත අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.
- ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට අවශ්‍ය උපදෙස් අමාත්‍යාංශය විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දි ඇති අතර, සංශෝධිත කාර්ය මණ්ඩල කෙටුම්පත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඉදිරිපත් කිරීමට නියමිතය.

### ❖ රැස්වීම්

2021 වර්ෂයේ මාණ්ඩලික නිළධාරී රැස්වීම් 03ක් සහ විශේෂ රැස්වීම් 07 ක් පවත්වා ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමට සියලුම අංශ ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. වර්ෂයේ සෑම මසකම මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීමක් පැවැත්වීමට නියමිතව තිබුනද 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ක්‍රියාත්මක වූ සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතු කොටගෙන මාණ්ඩලික නිලධාරී රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා ඇති අතර එහිදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමට සියළු අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත.

- **විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම**

2021.01.01 දින නව වසරේ රාජකාරී ආරම්භ කිරීමේ උත්සවය සංවිධානය කරන ලදී.

- **තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම**

තොරතුරු දැනගැනීමේ පනතට අදාළව ඉල්ලීම් 05 ක් අදාළ අංශ වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## 2022 ඉදිරි දැක්ම

අමාත්‍යාංශයේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇති අතර,ඒ සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතිය හා මහජන පැමිණිලි දත්ත කළමනාකරණ පද්ධති සහ ලේඛනාගාර දත්ත පද්ධතිය සකස් කර ඇත.එසේම අමාත්‍යාංශයේ වාහන දත්ත කළමනාකරණ පද්ධතිය සකස් කිරීමට මේ වන විට ආරම්භ කර ඇත.

## 2.2 - සැලසුම් අංශය

### 2021 ප්‍රගතිය

❖ **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2021 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතන වලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම නියමිත කාල සීමාව තුල සකස් කරන ලදි.

❖ **ප්‍රගති සමාලෝචන රැස්වීම්.**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරන ලදි. පවතින කොවිඩ් 19 තත්ත්වය යටතේ වුවද අපේක්ෂිත පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලදි. සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ද ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

❖ **ප්‍රගති වාර්තාකරණය.**

ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද, නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත මාසිකවද අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල ප්‍රගතිය ප්‍රමාදයකින් තොරව වාර්තා කරන ලදී. ඊට අමතරව, " සෞභාග්‍යයේ දැක්ම " ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ජනතා කේන්ද්‍රිය ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන " ගම සමඟ පිලිසඳර " වැඩසටහනට අදාලව මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වල ප්‍රගතිය මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින " යටිතල පහසුකම් කමිටුව " වෙත ප්‍රමාදයකින් තොරව මාසිකව වාර්තා කරන ලදී.

❖ **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබාගැනීම.**

2021 වර්ෂය අවසාන වන විට මෙම අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති 5 ක් පැවතිනි. එම සියළුම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ ඉන්දියානු රජය විසිනි.

2018 ජුලි 26 දින ඉදිකිරීම් ආරම්භ කළ ද කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතා හේතුවෙන් අතරමග නැවතුණු මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇලපත්ගම " පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය " මෙම වර්ෂයේදී නැවත ආරම්භ කරන ලදී. නිවාස හා නාගරික සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ මැදිහත් වීම මගින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ මුදල් අමාත්‍යංශය සමඟ කරන ලද සාකච්ඡා කීපයකින් අනතුරුව නව ඇස්තමේන්තු අනුව වැඩිපුර වැයකල යුතු මුදල් ශ්‍රී ලංකා රජය මගින් ලබා දීමේ එකගතාවය මත නැවත ආරම්භ කිරීමට හැකිවිය.

නිවාස 153 සම්පූර්ණ කිරීම සහ විහාරස්ථානය ආශ්‍රිත අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා ඉන්දියානු රජය මගින් තව දුරටත් ලබා දියහැකි රු.මි.253 ට අමතරව රු.මි. 195 ක මුදලක් ශ්‍රී ලංකා රජය මගින් යෙදවීමට කටයුතු කරන ලදී.

මෙම සියළුම ඉදිකිරීම් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) මගින් ඉටු කරවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට ශ්‍රී ලංකා රජයෙන් ලබා දෙන මුදලට අදාළ ඉදිකිරීම් සඳහා ගිවිසුම CECB ආයතනය සමග අත්සන් කර ඉදිකිරීම් අරඹා ඇත. ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයටද CECB ආයතනය සමග ගිවිසුම් අත්සන් කිරීමට අදාළ බැදුම්කර හා ගිවිසුම් කෙටුම්පත් ලබා දී ඇත. ඉදිරියේදී ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය විසින් එම කටයුතු ආරම්භ කරනු

ඇත. මීට අමතරව, " ශ්‍රී සෝභිත නාහිමි ගම්මානයට " නලජලය සැපයීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය වෙත ලබා දී මේ වන විට වැඩ ආරම්භ කර ඇත.

අනෙකුත් ඉන්දියානු නිවාස වැඩසටහන් 04 ද මේ වනවිට සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර වඩා වේගවත් කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී ගත් සාධනීය තීරණ අනුව ඒවා ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රගතිය වර්ධනය කර ගැනීමට හැකිවිය. මෙමගින් නිවාස 2400ක් දිවයින පුරා ඉදිකරනු ලැබේ. සියලුම ප්‍රතිලාභීන් අඩු ආදායම්ලාභීන් වේ. නිවාස ඉදිකරනු ලබන්නේ ප්‍රතිලාභීන් විසිනි. ප්‍රතිලාභීන්ට ඉන්දියානු රජයෙන් කොටස් වශයෙන් ඉදිකිරීම් ප්‍රගතිය අනුව අදාල කොටසේ ඉදිකිරීම් සිදු කල පසු ඔවුන්ගේ ගිණුම් වලට මුදල් බැර කරනු ලැබේ. නිවාස ඉදිකිරීමට පෙර අදාල කොටස් ගෙවීම කිරීමට ඉන්දියානු රජයේ අවබෝධතා ගිවිසුම වෙනස් කර අදාල ඉදිකිරීමට පෙර ප්‍රතිලාභීන්ට අවශ්‍ය මුදල ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රගතිය වේගවත් කර ගැනීමට හැකිවිය.

ඊට අමතරව, මේ වනවිට වෙළඳපලේ පවතින ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ඉහල යාමත් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන අනෙකුත් නිවාස වැඩසටහන් සඳහා රු.ලක්ෂ 06 ක මුදලක් ලබා දෙන බැවින්ද මෙම ප්‍රතිලාභීන් සඳහා ද අතිරේකව රුපියල් ලක්ෂක මුදලක් ශ්‍රී ලංකා රජයෙන් ලබා දීමට තීරණය කරන ලදී. එයද මෙම ව්‍යාපෘතිය වේගවත් කිරීමට බලපාන ලදී. 2020 වර්ෂය අවසානයේ වැඩ නිම කල නිවාස ගණන 272 වූ අතර 2021 වර්ෂය වන විට වැඩ නිම කල නිවාස ගණන 439 කි.

## 2022 ඉදිරි දැක්ම

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් 2021 වසර තුල ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති යෝජනා 18 ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම යෝජනා සියල්ලම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර ඒවායේ වටිනාකම රු.මි.10,815 .20 කි. මීට අමතරව, විදේශාධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා 02 ක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

# 2.3 - නිවාස හා සංවර්ධන අංශය

## 2.3.1 නිවාස අංශය

## 2021 ප්‍රගතිය

- **''ඔබට ගෙයක් - රටට හෙටක් '' නිවාස වැඩසටහන**

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම සුවපහසු නිවහනක ජීවත් වීමට ඉඩ සලසා දීම තුළින් ඵලදායී පුද්ගලයින් හා සතුටින් ජීවත් වන පවුලක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් "ඔබට ගෙයක්-රටට හෙටක්" නිවාස වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මෙම වැඩසටහන යටතේ තාවකාලික නිවසක පදිංචි අඩු ආදායම්ලාභී පවුල් සඳහා, එක් ප්‍රතිලාභී පවුලකට රු.ලක්ෂ 6 ක උපරිමයට යටත්ව ආධාර මුදලක් ඉදිකිරීමේ ප්‍රගතිය මත පදනම්ව ලබාදීම සිදු කෙරේ. තවද දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන මඟින් නිවාස අවශ්‍යතාවය පවතින ග්‍රාම නිලධාරී වසම් හා තාවකාලික නිවාස වැඩිවශයෙන් පවතින දිස්ත්‍රික්ක සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සිදු කෙරේ.

මෙම වැඩසටහනේ වාර්ෂික ඉලක්කය නිවාස 14,022 කි. 2020 වර්ෂයේ ආරම්භ කරන ලද නිවාස 9,972 න් නිවාස සියල්ලම මේ වන විට අවසන් කර ඇත. 2021 මුදල් අනුමත කරන ලද නිවාස 12,231න් 4,078 ක ඉදිකිරීම් අවසන් කර ඇත.

- **මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය**

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, බෞද්ධ කටයුතු

දෙපාර්තමේන්තුව ඒකාබද්ධව, බුද්ධ ශාසනය සඳහා දරුවන් පිදූ, ආර්ථික වශයෙන් දුෂ්කර මට්ටමක සිටින නිවසක් අහිමි හෝ අඩක් සාදන ලද නිවසක් හිමි දෙමව්පියන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ආධාර කිරීම සඳහා මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

"මිහිඳු නිවහන" නිවාස වැඩසටහන, මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහනෙහි උප වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන අතර ඒ අනුව මේ යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන්ට නව නිවසක් ඉදිකිරීම සඳහා මුදලින් රු. ලක්ෂ 06 ක ආධාරයක් ලබාදෙන අතර, අඩක් සාදා නිම කරන ලද නිවසක් සම්පූර්ණ කිරීම සඳහා රු. ලක්ෂ 06 ක උපරිමයක් දක්වා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශ කරනු ලබන මුදල් ආධාරයක් ලෙස ලබාදේ. (මීට අමතරව අදාළ විහාරස්ථානයෙන් හැකි අයුරින් දායකත්ව මුදලක් ලබාදීම සිදුකල හැකිය)

ඒ අනුව මේ දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කෑගල්ල, මාතලේ, මහනුවර, මාතර, හම්බන්තොට, මුලතිව්, ත්‍රිකුණාමලය හා වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි ප්‍රතිලාභීන් 758 ක් තෝරාගෙන නිවාස ආධාර ලබා දී ඇත. මින් නිවාස 201 ක වැඩ 2021.12.31 වන විට නිම කර ඇත.

❖ **විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය**

උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පැවති සටන් වලදී මියගිය, අතුරුදහන් සහ ආබාධිත රණවිරු පවුල් වෙත නිවාස ලබා දීමේ කටයුත්ත මෙමගින් සිදු කෙරේ. 2017,2018 හා 2019 වසර තුල ඉදිකිරීම් ආරම්භ කලද ඒවායේ වැඩ අවසන් කිරීමට නොහැකිව දිවයින පුරා නිවාස 946 ක් 2021 වසර ආරම්භය වන විට පැවතිනි. 2021 වසර තුල ඉන් නිවාස 673ක ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට හැකි වූ අතර ඒ සඳහා රු.මි 210 ක් වැය කරන ලදී.

❖ **සෑම මැතිවරණ කොට්ඨාශයකම මැදි ආදායම්ලාභී නිවාස 100ක් (මහල් නිවාස) ඉදිකිරීමේ ව්‍යාපෘතිය - "සියපත නිවාස වැඩසටහන"**

නිවාස නොමැති හා දීර්ඝ කාලීනව නාගරික ප්‍රදේශ ආශ්‍රිතව වාසය කිරීමේ අවශ්‍යතාවය ඇති මැදි ආදායම්ලාභී පවුල් සඳහා නිවාස සැපයීමේ අරමුණ පෙරදැරිව සෑම මැතිවරණ කොට්ඨාශයකම මැදි ආදායම්ලාභීන් ඉලක්ක කරගත් නිවාස 100ක මහල් නිවාස ව්‍යාපෘතියක් බැගින් ඉදිකිරීමට අපේක්ෂිතය.

මේ යටතේ,

- **ගම්පහ, මරඳගහමුල නිවාස ව්‍යාපෘතිය**

  මෙම වැඩසටහන යටතේ ප්‍රථම නියමු ව්‍යාපෘතිය ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මරඳගහමුල ග්‍රාම නිලධාරී වසමේ වැවේගොඩැල්ලවත්ත ඉඩමෙහි නිවාස 65 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2021.09.29 දින ආරම්භ කර ඇත. මෙහි ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදුකරනු ලැබේ.

- **අනුරාධපුර, දහයියාගම නිවාස ව්‍යාපෘතිය**

  අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහයියාගම පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙහි නිවාස 150කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් පෙර විකිණුම් පදනම යටතේ ඉදිකිරීමට යෝජිතය. මෙහි ඉදිකිරීම් කටයුතු රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මගින් සිදුකරනු ලබයි.

- **ඇඹිලිපිටිය, යෝධගම නිවාස ව්‍යාපෘතිය**

  රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ යෝධගම පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙහි නිවාස 120කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් පෙර විකිණුම් පදනම යටතේ ඉදිකිරීමට යෝජිතය. මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්) සමාගම යටතේ මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබේ.

❖ **සපිරි මහල් නිවාස වැඩසටහන**

- **මධ්‍යම පාන්තික නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය**

මෙම වැඩසටහන යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු මධ්‍යම ආදායම්ලාභීන් සඳහා දිවයින පුරා ප්‍රධාන නගර, අධිවේගී මාර්ග වල පිවිසුම් දොරටු, ප්‍රධාන මාර්ග හා දුම්රිය ස්ථාන වලට ආසන්න උප නගර කේන්ද්‍රකොට ගනිමින්, සියලු පහසුකම් වලින් සපිරි මහල් නිවසක් සහනාදායී ණය පහසුකම් සමඟ ලබාදීමට අපේක්ෂිතය.

මේ සඳහා ඉඩම් රජය මඟින් ලබාදෙන අතර, යටිතල පහසුකම් නිවාස ව්‍යාපෘතිය දක්වා ලබාදීම එම සේවා සපයන රේඛීය අමාත්‍යාංශය හා ආයතන මඟින් සිදු කරයි. මෙම නිවාස වැඩසටහන තුල නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම හා අලෙවිය අදාල නිවාස ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආයෝජනය සිදු කරන ආයෝජකයාගේ කාර්ය භාරය වන අතර, අධීක්ෂණය ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලබයි. ඉදිකිරීම් ආරම්භ කරන ලද සෑම නිවාස ව්‍යාපෘතියකින්ම ඉදිකරන නිවාස ඒකක සංඛ්‍යාවෙන් 70% ක් මධ්‍ය ආදාම්ලාභීන් සඳහා වෙන් කෙරෙන අතර, ඉතිරි 30%ක අර්ධ සුඛෝපබෝගී නිවාස ප්‍රමාණය වෙළෙඳපොල අවශ්‍යතාවය මත අලෙවි කිරීමට ආයෝජකයාට ඉඩ අවස්ථාව ලබාදී ඇත.

මෙම වසරේදී ජනතා අයිතියට පත් කරන ලද නිවාස වැඩසටහන්

මවුන්ට් ක්ලිෆර්ඩ් ව්‍යාපෘතිය (අදියර 2) - හෝමාගම (නිවාස 142)

මේ වන විට ඉදිකිරීම් සිදුකරන නිවාස ව්‍යාපෘති,

| | | |
|---|---|---|
| සී බ්‍රීස් නිවාස ව්‍යාපෘතිය | - වාද්දුව - නිවාස 196 | (ඉදිකිරීම් ප්‍රගතිය 61.98%) |
| ලාවන්‍යා හයිට්ස් ව්‍යාපෘතිය | - රාගම - නිවාස 134 | (ඉදිකිරීම් ප්‍රගතිය 49.96%) |

- **සොයිසාපුර පුනස්ථාපන නිවාස ව්‍යාපෘතිය**

1970 දශකයේදී ඉදිකරන ලද සොයිසාපුර ව්‍යාපෘති භූමියෙහි පිහිටි ඉතා පැරණි හා අබලන් දෙමහල් අඩුකුලී නිවාස 48 ක් හා අනවසර පැල්පත් 24 ක් පුනස්ථාපනය කිරීම සඳහා නිවාස 100ක සොයිසාපුර පුනස්ථාපන නිවාස ව්‍යාපෘතිය ආරම්භ විය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස 60ක් ඉදිකර පුනස්ථාපන පදනම මත නිවාසලාභීන් පදිංචි කර අවසන් කර ඇත.

ඉතිරි ගොඩනැගිලි පෙර විකුණුම් පදනම මත ඉදිකිරීමට යෝජිත අතර ඒ අනුව, වර්ග අඩි 550 බැගින් වන නිවාස 30ක් (ගොඩනැගිලි 2ක්) ඉදිකිරීමට සැලසුම් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2021.02.22 දින ආරම්භ කර ඇත.

- **යක්කල, වැරැල්ලවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය**

තරුණ පවුල්වලට නාගරික ප්‍රදේශ ආශ්‍රිතව දීර්ඝකාලීන පහසු ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමට හැකි වන පරිදි දිවයින පුරා විශේෂ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, යක්කල, වැරැල්ලවත්ත ප්‍රදේශයේ නිවාස 500 කින් යුත් නිවාස ව්‍යාපෘතියක් අදියර 03 ක් යටතේ ඉදිකිරීමට යෝජිතය. එම නිවාස ව්‍යාපෘතිය පිහිනුම් තටාකයකින්, ක්‍රීඩා පිට්ටනියකින් හා වෙළඳසැල් ආදී අංගයන්ගෙන් සමන්විත වේ.

මෙහි පළමු අදියර ලෙස මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් තුල වර්ග අඩි 600 කින් යුත් නිවාස 132 ක් හා වර්ග අඩි 900 කින් යුත් නිවාස 22 ක් වශයෙන් මුළු නිවාස 154 කින් සමන්විත මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2021.07.26 දින ආරම්භ කර ඇත.

- **තංගල්ල මහල් නිවාස ව්‍යාපෘතිය**

මෙම මහල් නිවාස ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර මේ වන විට ඉදිකිරීම් කටයුතුද සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස 30 ක් ඉදිකිරීමට අපේක්ෂිතය.

- **මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය**

මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර මහල් 24 කින් සහ නිවාස ඒකක 560 කින් සමන්විත වේ. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සීඩීසී ඉන්ඩස්ට්‍රියල් ඉන්ෆ්‍රාස් ලිමිටඩ් (CDC Industrial Infras (Pvt) Ltd) වෙත නැවත ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

❖ **විශේෂ නිවාස ව්‍යාපෘති**

- **2019.04.21 දින මීගමුව, කටුවාපිටිය, ශාන්ත සෙබෙස්තියන් දේවස්ථානයේ සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ බැතිමතුන් සඳහා නිවාස ඉදිකිරීම.**

2019 අප්‍රේල් මස 21 වන දින කොච්චිකඩේ, කටුවාපිටිය හා මඩකලපුව සියොන් යන දේවස්ථාන 03 ට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් විපතට පත් පුද්ගලයින්ගේ නිවාස අවශ්‍යතාවය ඉටු කිරීම මෙහි අරමුණයි.

මේ යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ගණන 223 ක් වන අතර නිවාස 184 ක ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.

- **සොඳුරු මහල් නිවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක රන්පොකුණුගම නිවාස ව්‍යාපෘතිය**

නිවසක් නොමැති හා නිවසක් ඉදිකිරීමට ඉඩමක් හෝ නොමැති ප්‍රධාන වශයෙන් කුලී පදනම මත ජීවත්වන ජනතාවගේ නිවාස අවශ්‍යතාවය පූර්නය කිරීම උදෙසා ඔවුනට දැරිය හැකි මුදලකට මිලදී ගත හැකි ආකාරයේ වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම "සොඳුරු මහල් නිවාස" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

එම වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතිය ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ රන්පොකුණගම නිවාස 72 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

❖ **ලෝක ජනාවාස දිනය - 2021**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්, 1985 වසරේ වාර්ෂික සැසිවාරයේදී ඉදිරිපත් කෙරුණු යෝජනාවකට අනුව 1986 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය (World Habitat Day) වශයෙන් ප්‍රකාශයට පත්කොට තිබේ. ඒ අනුව පසුගිය වසර 34 ක කාලය තුළ නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාළ විවිධ වූ තේමාවන් යටතේ ලෝක ජනාවාස දින සැමරුම සිදුකරනු ලැබීය. ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ (UN-Habitat) ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනය වන්නේ නිවාස විෂයභාර අමාත්‍යාංශයයි.

මෙම වසරේ ලෝක ජනාවාස දින තේමාව වුයේ "Accelerating Urban action for a carbon - free world" යන්නය. රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ජාතික උත්සවයක් පැවැත්වීමට නොහැකි විය. එහෙත් ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදි.

- ඉන්දියානු ආධාර යටතේ ඉදි වූ වවුනියාව මැණික් ෆාම් නිවාස ව්‍යාපෘතිය ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් 2021.10.04 දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මාර්ග ගත ක්‍රමය ඔස්සේ ජනතා අයිතියට පත් කිරීම.

- ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් " ඔබට ගෙයක් - රටට හෙටක් " තේමාව යටතේ අසිරිමත් නිවාස ව්‍යාපෘති" යන මැයෙන් තොරතුරු ඇතුලත් පුවත්පත් දැනවීමක් පලකිරීම.

- ලෝක ජනාවාස දින තේමාවට අනුගත වන පරිදි UN - Habitat ආයතනය විසින් සිදු කරන "One Planet Sustainable Building & Construction Program" යටතේ මෙම අමාත්‍යාංශය විසින් තිරසාර ඉදිකිරීම් ප්‍රවර්ධනය සම්බන්ධ " Mainstreaming Resource Efficiency in Housing Building & Construction Sector" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

❖ **නිවාස ව්‍යාපෘති හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ/ සටහන්**

2021 වර්ෂය තුල නිවාස විශයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් 13 ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

❖ **නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම**

2021 වර්ෂයේදී ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ පිලිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් වූ ග්‍රාමීය නිවාස සංවර්ධන විෂයට අදාල සියලුම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිලිතුරු සකස් කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න 06 ක් සඳහා අදාල පිළිතුරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඇතුළු අදාළ ආයතන සම්බන්ධ කර ගනිමින් සකස් කර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබාදීම සිදුකරන ලදී.

❖ **1972 අංක 07 දරණ ගෙවල් කුලී පනත සංශෝධනය කිරීම**

2018 අයවැය යෝජනාවට අනුව කුලී නිවාස වෙළඳපොළේ නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීමට නව නෛතික යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම පිණිස නව නීති කෙටුම්පතක් සම්පාදනය කිරීමට විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව අදාල නිලධාරීන්, පර්ශවකරුවන් හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ලබාදුන් අදහස් අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධනය කරන ලද නව පනත් කෙටුම්පත සියළුම පළාත් නිවාස කොමසාරිස්වරුන් වෙත නිරීක්ෂන, නිර්දේශ හා යෝජනා ගෙන්වා ගැනීම සඳහා යොමු කරන ලදී.

කෙසේ වෙතත් අධිකරණ අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2021.09.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ගරු අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී අති 2021.09.27 දිනැති තීරණය මඟින් 1972 අංක 07 දරණ ගෙවල් කුලී පනත සංශෝධනය සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත අනුමැතිය ලබා දී ඇත.

❖ **මහජන ඉල්ලීම්**

- ජනාධිපති කාර්යාලයෙන්, අග්‍රාමාත්‍ය කාර්යාලයෙන්, වෙනත් ආයතන වලින් සහ සෘජුව මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන ඉල්ලීම් අදාල ආයතන වෙත යොමු කිරීම හා ඉල්ලුම්කරුවන් වෙත ඒ බව දන්වමින් ඔවුන්ගේ අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා අයදුම්පත්‍රයක් යොමුකිරීමටත් නැවත ලැබෙන අයදුම්පත්‍ර වර්ග කර අදාල ආයතන වෙත යොමුකිරීමත් එම කාර්යන් ඉටුවන තුරු ඒ සම්බන්ධ පසු විපරම් කිරීමත් සිදුකරනු ලැබේ. ඒ අනුව මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ නිවාස ඉල්ලීම් 12,183 ක් සඳහා 2021.12.31 දින වන විට පිලිතුරු යවා ඇත.
- ජනාධිපති කාර්යාලයෙන් යොමුකරන ගම සමඟ පිළිසඳර වැඩසටහනේදී අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිවාස ඉල්ලීම් ඇතුලත් මහජන ඉල්ලීම් ලිපි අදාල ආයතන වෙත යොමු කිරීම හා ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂයේදී ඉල්ලීම් 1048 ක් ලැබී ඇති අතර ඒවා අදාල ආයතන වෙත යොමුකර ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇත.
- තවද මෙම සියලු මහජන ඉල්ලීම් හා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් දත්ත ගොනුවක් (Database) පවත්වාගෙන යනු ලැබේ.

## 2.3.2 ඉඩම් අංශය

2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන යටතේ ඔප්පු ලබා දීම සඳහා සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචි කළ යුතුව ඇති නිවාස යෝජනා ක්‍රමවලින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවට ලක් කර යෝග්‍යතා සහතිකයක් නිකුත් කළ පසු සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචි කළ හැකිය.

❖ ඉඩම් සම්බන්ධයෙන් මතුවූ ගැටළු නිරාකරණය සඳහා ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් 80 ක් අදාල අංශ වෙත යොමු කිරීම.

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ** 01.

වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටි සෝලයිකාඩු නැමැති රජයේ ඉඩම රාජ්‍ය සේවක නිවාස ව්‍යාපෘතියක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම.

❖ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම්වල ලේඛණයක් පවත්වාගෙන යාම.

❖ ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ දෙපාර්තමේන්තු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම - ඉල්ලීම් 26 ක්

❖ සියපත නිවාස යෝජනා ක්‍රමය සඳහා ඉඩම් හඳුනා ගැනීම.( දිස්ත්‍රික්ක 22 ක් හා ඉඩම් 202 ක් පමණ )

❖ 2021 වසරේ දිස්ත්‍රික්ක 25 සඳහා ඔප්පු 1785 ක් නිකුත් කර ඇත.

## 2.3.3 - ජාතික නිවාස කොමසාරිස් අංශය

## 2021 ප්‍රගතිය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ජාතික නිවාස කොමසාරිස් අංශය 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ පැවරී ඇති බලතල හා වගකීම් පරිදි

- කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීම.
- ජාතික නිවාස කොමසාරිස්වරයා පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
- පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති දේපල සම්බන්ධයෙන් වරින්වර පැන නැගෙන ගැටළු නිරාකරණය කිරීම යන අරමුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

2021.01.01 දින සිට 2021.09.01 දින අතර කාලය තුළ කොවිඩ් 19 වසංගතය වරින්වර සක්‍රීය වීම නිසා රට තුළ පැවති වාතාවරණය මත ජාතික නිවාස කොමසාරිස් අංශයේ කටයුතු සඳහා බලපෑම් වු බැවින් ක්ෂේත්‍ර පරීක්ෂණ සහ හිමිකම් සනාථ කිරීමට අදාලව පරීක්ෂණ පැවැත්වීමට බාධා සිදු විය.

එබැවින් 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ කාර්යාලයට පැමිණි මහජනතාවගේ ගැටළු සහ ලිඛිතව ඉදිරිපත් වු ගැටළු සඳහා විසඳුම් ලබා දිම සිදු කරන ලද අතර 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ සින්නක්කර ඔප්පු 04 ක් නිකුත්කර ඇත. එමෙන්ම ජාතික නිවාස කොමසාරිස් අංශයට 2021 වර්ෂය තුළ රජකාරිමය ලිපි 797 ක් ලැබී ඇති අතර, විවිධ ගැටළු සම්බන්ධව මහජනයා 557 දෙනෙකු ජාතික නිවාස කොමසාරිස් හමුවට පැමිණ ඇත. එසේම පිඹුරු පිටපත් 43 ක් නිකුත්කර ඇත. තවද නඩු කටයුතු වෙනුවෙන් විවිධ අධිකරණ ඉදිරියේ සාක්ෂි පිණිස පෙනී සිටිමද, අධිකරණ කටයුතු සඳහා ලේඛන සකස් කිරීම ද, නීතිපති වරයා සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාල කටයුතු ඉටුකිරීම ද, 1972 අංක 07 දරන ගෙවල් කුලී පනත සංශෝධනය කිරීමේ කටයුතුවලට සම්බන්ධවීම ද සිදුකර ඇත.

## 2022 ඉදිරි දැක්ම

❖ මෑත කාලය වනතුරු පුරප්පාඩුව පැවතුණ 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ නිවාස දේපල උපරිම සමාලෝචන මණ්ඩලය සහ තක්සේරු මණ්ඩලය දැනට පත් වී ඇති බැවින් ඒ තුළින් ප්‍රමාද වී පැවතුණ ඔප්පු ලබා දිමේ කටයුතු කඩිනම් කිරීම.

❖ ජාතික නිවාස කොමසාරිස්වරයාට පැවරී ඇති සහාධිපත්‍ය දේපළ සම්බන්ධව ඇති ගැටළු 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට අනුව විසදිම තුළින් ඒවායේ පදිංචි කරුවන්ට ඔප්පු ලබා දීමට අදාල කටයුතු සිදු කිරීම.

❖ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත පැවරී ඇති එහෙත්, මෙතෙක් හදුනා නොගත් නිවාස දේපල හදුනා ගැනිමට කටයුතු කිරිම සහ අදාල තොරතුරු ලේඛන ගත කිරිම.

- ස්ථානීය පරීක්ෂණ සහ කාර්යාලීය පරීක්ෂණ පවත්වා නිවාස වල පදිංචි කරුවන්ගේ/කුලී නිවැසියන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීම.
- කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දිම.
- නඩු කටයුතු සඳහා අධිකරණ තුල සාක්ෂි පිණිස පෙනී සිටීම, නීතිපති දෙපාර්තමේන්තුවේ නීති උපදෙස් සඳහා සාකච්ඡාවලට සහභාගිවීම, නීතිපතිවරයා සමග අධිකරණ කටයුතු පිළිබඳව අදාලවන කටයුතු ඉටුකිරීමට නියමිතය.

## 2.4 - තාක්ෂණ අංශය

### 2021 ප්‍රගතිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග 15 ක් සහ රීති 09 ක් අනුමත කල යුතුව ඇත. එයින් නියෝග 13 ක් පාර්ලිමේන්තුව මඟින් අනුමත කර ඇත. ඊට අමතරව තවත් නියෝග 02 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. එයට අමතරව රීති 06 ක් මේ වන විට ගැසට් කර ඇති අතර තවත් රීති 03 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

එමෙන්ම අමාත්‍යාංශයට අයත් සුවිශේෂී ප්‍රමුඛතාවක් වන ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම ප්‍රමාද වීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් අන්තර්ජාලය ඔස්සේ සියලු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන කටයුතු සම්බන්ධීකරණය ද සිදු කෙරේ.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පී හිඟයට පිළියමක් ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නිපුණතා පාදක ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතන පනත සහ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතන පනත සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු ද මෙම අංශය මගින් මේ වන විට සිදු කරමින් පවතී.

එමෙන්ම, ඉදිකිරීම් පරිශ්‍රවල ඩෙංගු මදුරුවන් පැතිරීම පාලනය කිරීම සඳහා වන විධිවිධාන සම්බන්ධයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ ද මෙම අංශය මගිනි.

ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම කොන්ත්‍රාත්කරුවන් ඇතුළුව ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ සියළු පිරිස් වලට තදින් බලපා ඇති ප්‍රශ්නයක් බව අවබෝධ කොට ගෙන පහත ක්‍රියා මාර්ග ඒ සඳහා පසුගිය වසර තුළ මෙම අංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.

- ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල නියාමණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය ඇතුළු පාර්ශව සමඟ සාකච්ඡා පවත්වා ඉදිරි කටයුතු සිදු කිරීම.
- මාස තුනකට වැඩි කොන්ත්‍රාත් කාල සීමාවක් සහිත ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා මිල විචලන ගෙවීම පිළිබඳ වගන්තිය ගිවිසුම් වලට ඇතුලත් කර ඒ අනුව කටයුතු කලයුතු බවට සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීම.
- මාස තුනකට වැඩි කොන්ත්‍රාත් කාල සීමාවන් සහිත කොන්ත්‍රාත් ගිවිසුම් වල මිල විචලන ගෙවීම පිළිබඳ වගන්තිය සඳහන් නොවූව ද ඒ සඳහා ගෙවීම් කිරීමට හැකිවන ලෙස අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර එය අනුමත කර ගැනීමට කටයුතු කිරීම.
- මිළ විචලන සූත්‍රය සහ මිළ දර්ශක පිළිබඳව නැවත සළකා බැලීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කිරීම.

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව පිහිටුවන ලද ඉදිකිරීම් පිළිබඳ උපදේශක සභාව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රැස් කිරීමේ දුෂ්කරතා ඇති වුවද, රැස්වීම් වාර දෙකක් පවත්වන

ලද අතර අදාල පනත සංශෝධනය කිරීම ඇතුළු ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ රාශියක් එමගින් අනුමත කර ගැනීමට හැකි විය.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ ටවර්හෝල් රඟහල පදනම යන ආයතන දෙකම එකම ගොඩනැගිල්ලක පවත්වා ගෙන යාම හේතුවෙන් ඇතිවී ඇති ප්‍රශ්න සඳහා අමාත්‍යාංශය මගින් මැදිහත්ව ඒ සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ තීරණය පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරණ ලදී.

අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳ ආරවුල් පිළිබඳ පැමිණිලි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඒ පිළිබඳ මැදිහත්වීම සිදුකරණ ලදී.

එමෙන්ම, ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන මගින් නිරතුරුව ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය  කර විසදුම් ලබා දීම සිදුකරන ලදී.

අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාල මිල ගණන් ඇගයීම අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව (STC) විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව 2021.12.31 දිනට ව්‍යාපෘති 80ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිළ ගණන් සඳහා කමිටුවේ සුපරීක්ෂණය යටතේ අනුමැතිය ලබා දී ඇත.

ඉදිකිරීම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ඉහත කමිටුවේ සභාපතීත්වය මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හිමිව ඇති අතර ඉදිකිරීම් කටයුතු කරනු ලබන අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන වල ද මිළ ගණන් සලකා බලා කොන්ත්‍රාත් ආයතන වලට ද අසාධාරණයක් නොවන පරිදි සාධාරණ මිළ ගණන් ලබා දීමට ස්ථාවර තාක්ෂණ කමිටුව කටයුතු කරන ලදී.

එසේම පසුගිය වසර ගණනාවක් පුරා ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතිය ලබා දීමට පමාවී තිබූ ව්‍යාපෘතීන්හි ගැටළු විසදා ගැනීමට කටයුතු කර ඒවා සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතිය ලබා දී ඇත.

## 2022 ඉදිරි දැක්ම

- ❖ ඉදිකිරීම් උපදේශක සභාව රැස්වීම් සෑම කාර්තුවක් සඳහාම පවත්වා ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධ නිර්දේශ ලබා ගැනීම.
- ❖ 2014 අංක 33 දරණ ඉදිකිරීම් සංවර්ධන පනත සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- ❖ 2014 අංක 33 දරණ ඉදිකිරීම් සංවර්ධන පනත යටතේ තව දුරටත් අනුමත කර ගැනීමට ඇති නියෝග දෙකක් හා රීති තුනක් ගැසට් පත්‍රයේ පළ කිරීම හා නියෝග පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගැනීම.
- ❖ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතන පනත හා 2007 අංක 20 දරණ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතන පනත සංශෝධනය කිරීමට අදාල යෝජනා කමිටුවක් මගින් සලකා බලා පනත්  සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක මගින් සකස් කර අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- ❖ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්යයන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධිකරණය කිරීම.
- ❖ ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව විවිධ පාර්ශව වලින් ඉදිරිපත් වන යෝජනා හා ගැටළු සම්බන්ධයෙන් අදාල ආයතන අතර සම්බන්ධීකරණය සිදු කර විසදුම් ලබා දීම.
- ❖ ස්ථාවර තාක්ෂණ කමිටුවට ලැබෙන ලිපිගොනු හැකි ඉක්මණින් නිම කිරීමට කටයුතු කිරීම.

## 2.5 - ඉදිකිරීම් අංශය

### 2021 ප්‍රගතිය

#### ❖ අමාත්‍ය මණ්ඩල සංදේශ

- සී-සිටි ව්‍යාපෘතියේ ශේෂ වැඩ සම්පූර්ණ කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම.

- සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත එක් මිල කැඳවීමකින් රාජ්‍ය ආයතන වලට රුපියල් මිලියන 50ක භාණ්ඩ ලබාගැනීමේ අනුමැතිය 2022.12.14 දක්වා දීර්ඝ කිරීම.
- රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත පිරිනමනු ලබන ඍජු කොන්ත්‍රාත් සඳහා අදාල අත්තිකාරම් මුදල් හා කාර්යසාධන සඳහා බැංකු ඇපකර හා බැඳුම්කර ලබා දීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම.
- මාධ්‍ය පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා සවලීකරණය හා වැඩ ආරම්භ කිරීම වෙනුවෙන් ලබා දිය හැකි අත්තිකාරම් මුදල කොන්ත්‍රාත් මුදලින් 30 % දක්වා වැඩිකිරීම.
- ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමට අයත් දෙල්කඳ, ගංගොඩවිල වරලත් මිනින්දෝරු ගාමිනී. බී. දොඩන්වල මහතා විසින් මිනුම් කර සකස් කර ඇති පිඹුරුපත් අංක 1340 හි කැබලි අංක 04හි මහල් නිවාස ව්‍යාපෘතියක් සිදු කිරීම.

❖ **යොමු ගත අනෙකුත් කාර්ය භාරයන්**

- සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් සෙරමික් ටයිල් ආනයනය කර බෙදා හැරීම සඳහා ගැසට් පත්‍රයක් මඟින් අවසර ලබා ගැනීමට කටයුතු කිරීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වෙනත් අමාත්‍යංශ දෙපාර්තමේන්තු සඳහා ගෙවිය යුතු හිඟ මුදල් පියවීමට අවශ්‍ය පියවර ගැනීම. (2021.07.01 දක්වා)
- මරදගහමුල වී ගබඩා හා වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු කිරීම, වෙළඳ සංකීර්ණයේ වෙළඳ කුටි 115 හි ඉදිකිරීම් වල ඉතිරි වැඩ අවසන් කිරීම සහ එම වෙළඳ කුටි නඩත්තු කර පවත්වාගෙන යාම වෙනුවෙන් අමාත්‍යංශ මට්ටමින් මැදිහත් වීම. (2021.07.01 දක්වා)
- කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දෙව්මැදුරෙහි ඉරිදා දහම් පාසල් ගොඩනැගිල්ලෙහි ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කරගැනීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් කටයුතු කිරීම.
- රන්පොකුණුගම යෝජිත අඩු ආදායම්ලාභී තෙමහල් නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධව කටයුතු කිරීම.

## 2022 ඉදිරි දැක්ම

- ❖ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යන ආයතන සමග මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම. ඒ තුලින් සෑම ආයතනයක්ම විධිමත් පරිදි ලාභ ලබන ආයතන ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමාත්‍යංශ දායකත්වය ලබා දීම.
- ❖ දැනට ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇති සියපත නිවාස ව්‍යාපෘතියෙහි පිරිවැය අඩු කිරීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ සමග සම්බන්ධවී සුදුසු තාක්ෂණික ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- ❖ දැනට පැහැදිලි ප්‍රගතියක් අත් කරගෙන ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙහි ඉදිරි ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම සහ අමාත්‍යංශ මට්ටමින් ඒ සඳහා අවශ්‍ය පූර්ණ සහාය ලබා දීම.
- ❖ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට රජයේ ආයතන වලින් වසර 10ක පමණ කාලයක සිට ලැබිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් පියවර ගැනීම.
- ❖ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත වෙනත් ආයතන වලින් ලබාගත හැකි ව්‍යාපෘති ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
- ❖ ඉහත කාර්යන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අවශ්‍ය වී නම් ඒ සඳහා කඩිනම් පියවර ගැනීම.
- ❖ අප ඉදිකිරීම් අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්ය භාරයන් ආවරණය හා ඉලක්ක පරිදි ඉටුවන ලෙස අංශයට අදාලව සුදුසු පියවරයන් ගැනීම.

## 2.6 - ඉංජිනේරු සේවා අංශය

### 2021 ප්‍රගතිය

### ❖ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
- කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත බන්ධනාගාර වැඩබිමෙහි උපදේශන කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබා ගැනීමට අදාළව.
- ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග කාපට් කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලැබීමට ඇති හිඟ මුදල් ලබා ගැනීමට.

අනෙකුත් කාර්ය භාරයන් -

### ❖ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වෙනත් අමාත්‍යංශ දෙපාර්තමේන්තු සඳහා ගෙවිය යුතු හා අයවිය යුතු හිඟ මුදල් පියවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- මරදගහමුල වී ගබඩා සංකීර්ණයේ වෙළෙඳ කුටි 115හි ඉදිකිරීම් වල ඉතිරිවැඩ අවසන් කිරීම හා එම වෙළෙඳ කුටි නඩත්තුකර පවත්වාගෙන යාම සඳහා අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීම් සිදුකිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.
- ඩොලමයිට් වැඩබිමෙහි කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය හා මැදිහත්වීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය විමසීම සඳහා අදාළ ආකෘති පත්‍රයක් හඳුන්වා දීම.
- හම්බන්තොට වීරවිල තරුණ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්, දෙබරවැව හා සූරියවැව ජාතික පාසල්වල පිහිනුම් තටාක ඉදිකිරීම යන ව්‍යාපෘති ඉදිරියට කරගෙනයාම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වැඩබිම් සඳහා Key Performance Indicators (KPI) ක්‍රමය හඳුන්වාදීම.
- දෙමටගොඩ පෙරනිම් අංගනයේ කොන්ක්‍රීට් සිල්පර ආදී නිශ්පාදන කටයුතු කරගෙනයාම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වැඩබිම් වල ආදායම් හා වියදම් වාර්තා සකස් කිරීම.

### ❖ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

- ලුණුගම්වෙහෙර ජාතික වන උද්‍යානය තුළ අලි අගලක් ඉදිකිරීම, කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම, ඇවිදින මංතීරු හා භූ දර්ශන සංවර්ධනය, කජු වගාකිරීම සඳහා භූමිය සකස් කිරීම ආදී සංවර්ධන ක්‍රියවලියේදී ඇතිවන ගැටළු අවස්ථාවලදී මැදිහත්වී උපදෙස් ලබාදීම.
- වාරි සෞභාග්‍යා යටතේ ක්‍රියාත්මක වන වැව් ව්‍යාපෘතියේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දීම.
- අතිකාල ගෙවීම් සහ දිරි දීමනා ගෙවීම් සම්බන්ධයෙන් කරුණු ඇතුළත් කළයුතු ආකාරය දැක්වෙන ආකෘති පත්‍රයක් හඳුන්වා දීම.
- යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කළයුතු ආකාරය දැක්වෙන ආකෘති පත්‍රයක් හඳුන්වා දීම.
- කොළොන්නාව ප්‍රාදේශීය කාර්යාලයේ අපේක්ෂිත ඉදිරි සැලසුම යන ව්‍යාපෘති හා කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වී කටයුතු කිරීම.

## 2022 ඉදිරි දැක්ම

- ❖ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය යන ආයතන සමග මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම හා ඒ තුලින් සෑම ආයතනයක්ම විධිමත් පරිදි ලාභ ලබන ආයතන ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමාත්‍යංශ දායකත්වය ලබා දීම.
- ❖ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ක්‍රියාත්මක කරනු ලබන Key Performance Indicators (KPI) ක්‍රමය පවත්වාගෙනයාමට අදාළ සහාය අමාත්‍යාංශ මට්ටමින් ලබාදීම.
- ❖ දෙමටගොඩ පෙරනිම් අංගනයේ කොන්ක්‍රීට් සිල්පර ආදී (Concrete sleepers) නිශ්පාදන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙනයාම හා එම නිශ්පාදන කටයුතු වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය සහාය අමාත්‍යාංශ මට්ටමින් ලබාදීමට කටයුතු කිරීම.
- ❖ දැනට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතීන් කඩිනමින් නිමකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- ❖ ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතියේ හිඟ මුදල් ලබා ගැනීම සඳහා තව දුරටත් කටයුතු කිරීම.
- ❖ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීම.
- ❖ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත වෙනත් ආයතන වලින් ලබාගත හැකි ව්‍යාපෘති ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
- ❖ ඉහත කාර්යන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතීන් අවශ්‍ය වී නම් ඒ සඳහා කඩිනම් පියවර ගැනීම.
- ❖ අප ඉංජිනේරු සේවා අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්ය භාරයන් ආවරණය හා ඉලක්ක ඉටුවන ලෙස අංශයට අදාලව සුදුසු නිසි පියවරයන් ගැනීම.

# 2.7 - මූල්‍ය අංශය

## 2021 ප්‍රගතිය

2021 වර්ෂය සඳහා අයවැය ලේඛනය මගින් සලසා දී ඇති මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වලට අදාළ අක්මුදල් ලබාගෙන එම මුදල් උපරිම කාර්යක්ෂමතාවයකට පත් කිරීම සඳහා ආයතනයන් තුළ නිසිකලට බෙදාහරිමින් වාර්තා පවත්වාගෙන යාම හා මාසික, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නිසි වේලාවට ලබාදීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

2021 වර්ෂය සඳහා රු.මිලියන 17202.10 ක් හා 624.44 පිළිවෙලින් මූලධන හා පුනරාවර්තන වියදම් වශයෙන් අයවැය වාර්තාවෙන් වෙන් කර තිබුණි. එම මූල්‍ය ප්‍රතිපාදන වලින් මූලධන සඳහා රු.මිලියන 12954.80 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 418.90 ක්ද වැයකර ඇත.මෙහිදි මූලධන වියදම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රධාන වශයෙන් අඩු අදායම් ලාභීන්ට නිවාස ඉදිකිරීම සඳහා වැය කර ඇත.

## 2022 ඉදිරි දැක්ම

අමාත්‍යංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වස් ඒ ඒ අංශ සමග මනා සම්බන්ධීකරණයන් පවත්වා ගනිමින් අමාත්‍යංශයට අවශ්‍ය වන සියළුම ද්‍රව්‍ය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම මගින් අමාත්‍යංශ ඉලක්ක වලට ළගාවීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම සිදු කෙරේ.

එමෙන්ම මනා මූල්‍ය පාලනයන් පවත්වාගෙන යාම සඳහා නව ක්‍රමවේද හදුන්වා දීමද මූල්‍ය අංශය මගින් සිදු කෙරේ.

# 2.8 - අභ්‍යන්තර විගණන අංශය

## 2021 ප්‍රගතිය

2021 වර්ෂයේ විගණන වාර්තා 05 ක කටයුතු අවසන් කර ඇත. කොරෝනා වසංගතය හේතුවෙන් 2021.12.31 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 න් 03 ක් පවත්වා ඇත. අමාත්‍යාංශයේ විමර්ශන 03ක හා අනුබද්ධිත ආයතනයන්හි විමර්ශන 10 ක් අවසන් කර ඇති අතර විමර්ශන 03 ක කටයුතු සිදු කරමින් පවතී.

## 2022 ඉදිරි දැක්ම

2021 වර්ෂයේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වුවත් 2022 වර්ෂයේදි විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටු කිරීමටත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් කාර්තුමය වශයෙන් පැවැත්වීමටද විගණන වැඩසටහනට ඇතුලත් කර ගෙන ඇත.

# 2. 9 - නැවත පදිංචි කිරීමේ අංශය

## 2021 ප්‍රගතිය

අවතැන්වුවන් නැවත පදිංචි කිරීමට අදාලව 2021 වර්ෂය තුල උතුරු පළාතේ පවුල් 2666 කට අයත් පුද්ගලයන් 7337 ක්ද නැගෙනහිර පළාතේ පවුල් 19 කට අයත් පුද්ගලයන් 54 ක් ද නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට අමාත්‍යාංශයට හැකි විය. සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම අමාත්‍යාංශය විසින් පවුල් 2685 ක් පුද්ගලයන් 7391 ක් ද උතුරු හා නැගෙනහිර පළාත් වල නැවත පදිංචි කරනු ලැබ ඇත.

### ❖ ගඩොල් හා බදාම ආකාරයේ නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතිය

උතුරු නැගෙනහිර පළාත් වල 2021 වර්ෂයේදි අවතැන් වු පවුල් සඳහා ස්ථිර නිවාස 5953 ක් ඉදිකිරීම් ආරම්භ කරන ලදි. එලෙස ආරම්භ කරන ලද නිවාස අතරින් නිවාස 142 ක අත්තිවාරම් මට්ටම දක්වාද නිවාස 890 ක් බිත්ති මට්ටම දක්වාද නිවාස 2326 ක් වහල මට්ටම දක්වාද නිවාස 2533 ක් සම්පූර්ණ නිම් මට්ටම දක්වාද ඉදි කිරීම් අවසන් කර ඇත . නිවාස ඉදිකිරීම සඳහා සමස්ථ වියදම ලෙස මෙම ව්‍යාපෘතියේ රුපියල් මිලියන 3757 ක් වාර්තා විය. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රගතිය 75%ක් වේ.

### ❖ අර්ධ හානි නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

නැවත පදිංචි කරන ලද පවුල් වල අර්ධ හානි නිවාස නැවත ප්‍රතිසංස්කරණය සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි ඒ අනුව 2021 වර්ෂය තුළ නිවාස ඒකක 298 ක් ප්‍රතිසංස්කරණය සඳහා කටයුතු කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 55.45 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රුපියල් මිලියන 45 ක් වැයකර 81% ක ප්‍රගතියක් ලගා කර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය ත්‍රිකුණාමලය හා මඩකළපුව දිස්ත්‍රික්කයන්හි ක්‍රියාවට නැගිනි.

### ❖ ඉඩම් අහිමි පවුල් සඳහා ඉඩම් මිළදි ගැනිම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබා දීම

ගැටුම්කාරි වතාවරණය හේතුවෙන් අවතැන්ව තම මුල් ගම්බිම් හා මුල් පදිංචි ඉඩකඩම් අහිමිවු පවුල් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් ඒකක 209 ක් මිළදි ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 53.39 ක ප්‍රතිපාදන යාපනය දිස්ත්‍රික්කය වෙත 2021 වර්ෂයේදි වෙන් කර තිබුනි. එම ප්‍රතිපාදන අතරින් රුපියල් මිලියන 35 ක මුල්‍ය ප්‍රගතියක් කරා ලගා වී තිබුනි.

### ❖ සනිපාරක්ෂක පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය

ගැටුම්කාරි වතාවරණය හේතුවෙන් අවතැන්ව නැවත පදිංචි කළ ජනතාවගේ සනිපාරක්ෂක පහසුකම් ඉහළ නැංවීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබිනි. උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි යාපනය, මුලතිව්, කිළිනොච්චි, වව්නියාව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක තුළ ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 262.60 ක මුදලක් 2021 වර්ෂය තුළ වෙන් කර තිබුනි. ඒ යටතේ පවුල් 3686 කට සනීපාරකෂක පහසුකම් පද්ධති 3686 ක් ඉදිකර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය 100% ක් වේ.

### ❖ ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදීම

නැවත පදිංචි කරන ලද පවුල් වල ආර්ථික හා සමාජීය සුරක්ෂිතතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා 2021 වසර තුළ එකී පවුල් වෙනුවෙන් ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදීමට කටයුතු කරනු ලැබීය . එමෙන්ම ගෘහස්ථ විදුලි සම්බන්ධතා 2811 ක් ලබාදිමට 2021 වසර තුළ රුපියල් මිලියන 35 ක් වෙන් කොට තිබුනි. මෙහිදි එක් නිවාස ඒකකයක් සඳහා විදුලි බලය ලබා දිමට රුපියල් 20,000 ක මුදලක් මෙම අමාත්‍යාංශය විසින් දරා ඇත. ඒ අනුව උතුරු හා නැගෙනහිර පළාත් වල ගෘහස්ථ විදුලි සම්බන්ධතා 2811 ක් ලබා දිම අවසන් කර 100% ප්‍රගතියක් මෙම ව්‍යාපෘතියද ලගා කර ගෙන ඇත.

### ❖ නැනෝ සහ RO තාක්ෂණයෙන් යුත් පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

නැවත පදිංචි කරන ලද පවුල් වෙසෙන ප්‍රදේශයන්හි පවතින සීඝ්‍ර වකුගඩු රෝග ව්‍යාප්තිය වලක්වා ගැනීම සඳහා පිරිසිදු පානීය ජලය ලබා ගැනිමට පවතින දුෂ්කරතා සැළකිල්ලට ගෙන නැනෝ සහ RO තාක්ෂණයෙන් යුත් පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වසර තුළ කටයුතු කර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 460 ක ප්‍රතිපාදන වෙන් කර තිබුනි. ඒ අනුව උතුරු නැගෙණහිර පළාත්හි මෙම ඒකක 135ක් ඉදි කිරීමට කටයුතු කර ඇත.

### ❖ බිම් වෙඩි ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය

උතුරු හා නැගෙනහිර පළාත් වල තවදූරටත් ශේෂව ඇති බිම් වෙඩි හා පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ ක්‍රියාවලිය නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා මහත් රුකුලක් වන අතර එකී බිම් වෙඩි හා පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ ක්‍රියාවලියට අදාල ව්‍යාපෘති වෙනුවෙන් අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළ රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදන ලබාදී ඇත.

ඒ යටතේ 2021 වසර තුල බිම් වෙඩි නිසැක කර ඇති භූමි ප්‍රමාණය වර්ග කි.මී 4.3 ක්ද, පුද්ගල නාශක බිම් වෙඩි ඉවත් කල ප්‍රමාණය 20,175 ක්ද, යුධ ටැංකි නාශක බිම් වෙඩි 47 ක්ද, කුඩා අවි 41,661 ක්ද, පුපුරා නොගිය අවි කොටස් 5,930 ක්ද වේ.

## 2022 ඉදිරි දැක්ම

2022 වර්ෂයේදී උතුරු හා නැගෙනහිර පළාත් වල තවදුරටත් ඥාති හිත මිත්‍රාදීන් සමග සුභසාධන මධ්‍යාස්ථාන වල සිටින පවුල් 2,909 කට අයත් පද්ගලයින් 8,767 ක් නැවත පදිංචි කිරීමේ අපේක්ෂාවෙන් සිටිති. මොවුන් අතරින් යාපනය දිස්ත්‍රික්කයේ සුභසාධන මධ්‍යාස්ථාන 19 ක පවුල් 295 කට අයත් පුද්ගලයින් 807 ද අයත්ව ඇත. තවද යාපනය දිස්ත්‍රික්කයේ ඇති සුභසාධන මධ්‍යාස්ථාන වල සිටින ඉඩම් අහිමි පවුල් සඳහා ඉඩම් මිලදී ගෙන නැවත පදිංචි කිරීමටද බලාපොරොත් තු වේ.

උතුරු හා නැගෙනහිර පළාත් තුල අවතැන් වු පවුල් සඳහා ඉදිකල යුතු මුළු නිවාස ගණන 30,225 ක් වන අතර 2022 වර්ෂය තුලදි ලැබී ඇති ප්‍රතිපාදන මත පදනම්ව නිවාස 1,200 ක් ඉදිකිරීමට අපේක්ෂිතය. එසේම උතුරු හා නැගෙනහිර පළාත් තුල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 259.05 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එම ප්‍රතිපාදන උපයෝගි කොට ගෙන අවතැන් වු පවුල් සඳහා පානිය ජල පහසුකම් ලබාදිම, සනිපාරක්ෂක ඒකක ලබාදිම, ඇතුළු සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබයි.

බිම්බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ තවදුරටත් බෝම්බ ඉවත් කිරීම සඳහා ඉතිරිව ඇති මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී 13.5 ක් වන අතර 2022 වර්ෂයේදී වර්ග කි.මී 5 ක භූමි ප්‍රමාණයක බිම්බෝම්බ ඉවත් කිරීමට ඉලක්ක කර ඇත. මේ සඳහා 2022 වර්ෂයේදී රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

**ප්‍ර.ග.නි./** 

..............................................................................................
**ග.නි./ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය**




# පරිච්ඡේදය 3

**2021** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වු වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

**2021-12-31 දිනෙන් අවසන් වු කාල සීමාව සඳහා වන**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| | | | **තත්‍ය** |
|---|---|---|---|
| **අයවැය 2021 රු.** | | **සටහන** | **2021 වර්ෂය රු.** |
| - | **ආදායම් ලැබීම්** | | - |
| - | ආදායම් බදු | 1 | - |
| - | ගෘහස්ථ භාණ්ඩ හා සේවා සඳහා බදු | 2 | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම සඳහා බදු | 3 | - |
| - | බදු නොවන ආදායම සහ වෙනත් අය | 4 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | |
| | | | |
| - | **ආදායම් නොවන රිසිට්පත්** | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 8,715,703,000 |
| | තැන්පතු | | 16,705,708 |
| - | අත්තිකාරම් ගිණුම් | | 17,662,990 |
| - | වෙනත් ලැබීම් | | - |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **8,750,071,698** |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ)=(අ)+(ආ)** | | **8,750,071,698** |
| | **භාණ්ඩාගාරයට යැවූ ප්‍රේෂණ(ඈ)** | | - |
| - | **මුළු ආදායම් ලැබීම් සහ මුළු ආදායම් නොවන ලැබීම් (ඉ)=(ඇ)-(ඈ)** | | **8,750,071,698** |
| | | | |
| | **අඩුකලා - වියදම** | | |
| - | **පුනරාවර්තන වියදම්** | | |
| 202,000,000 | වේතන,වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ | 5 | 180,708,154 |
| 213,840,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 128,077,087 |
| 208,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුවීම් | 7 | 110,179,407 |
| - | පොලී ගෙවීම් | 8 | - |
| 300,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - |
| 624,440,000 | **මුළු පුනරාවර්තන වියදම්(ඊ)** | | **418,964,648** |
| | | | |
| | **ප්‍රාග්ධන වියදම්** | | |

| | | | |
|---|---|---|---|
| 22,550,000 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 4,114,363 |
| 41,042,000 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම | 11 | 19,554,936 |
| 11,175,900,000 | ප්‍රාග්ධන මාරුවීම් | 12 | 8,952,642,280 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - |
| 1,300,000 | ධාරිතා ගොඩනැගීම | 14 | 804,000 |
| 5,954,750,000 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | 3,977,686,551 |
| 17,195,542,000 | **මුළු ප්‍රාග්ධන වියදම් (උ)** | | **12,954,802,130** |
| | | | |
| | තැන්පතු ගෙවීම් | | 14,368,102 |
| | අත්තිකාරම් ගෙවීම් | | 14,019,107 |
| | අනෙකුත් ප්‍රධාන ගෙවීම් | | - |
| | **මුළු ප්‍රධාන ගෙවීම්( ඌ)** | | **28,387,209** |
| | | | |
| | **මුළු වියදම එ-(ඊ+උ+ඌ)** | | 13,402,153,987 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ-(ඉ-එ)** | | (4,652,082,289) |
| | | | |
| | **සුළු මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (4,652,082,289) |
| | **දෙසැම්බර් 31 දිනට සුළු මුදල් අග්‍රිමය අනුව ශේෂය** | | (4,652,082,289) |
| | | | - |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

| | සටහන | තත්‍ය වර්තමාන වර්ෂය 2021 රු. |
|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | |
| දේපළ,පිරියත හා උපකරණ | **ඒසීඒ -6** | 538,760,412.87 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ -5/5(අ)** | 34,452,398.68 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ -3** | - |
| **මුළු වත්කම්** | | 573,212,811.55 |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | |
| ශුද්ධ වත්කම් | | 31, 868, 111. 16 |
| දේපළ,පිරියත හා උපකරණ සංචිතය | | 538,760,412.87 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ - 5(ආ)** | |
| **<u>ජංගම වගකීම්</u>** | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ -4** | 2,584,287.52 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ -3** | - |
| **මුළු වගකීම්** | | 573, 212, 811. 55 |

පිටු අංක 07 සිට 69 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 70 සිට 79 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| .. | ......................... | ...................................................... |
| ද ලධාරි | ගණන් දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර: | දිනය: 2022.02.25 |
| දිනය : 2022.02.25 | දිනය : | |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසිඒ - සී**

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**
**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | තත්‍ය |
|---|---|
| | 2021 වර්ෂය |
| | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | |
| මුළු බදු ලැබීම් | - |
| ගාස්තු, අධිභාර,දඩ මුදල් සහ බලපත්‍ර | - |
| ලාභ | - |
| ආදායම් නොවන ලැබීම් | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 154,234,684 |
| අග්‍රිම ලැබීම් | 8,715,703,000 |
| අත්තිකාරම් ලැබීම් | 13,213,864 |
| තැන්පතු ලැබීම් | 16,705,708 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | 8,899,857,256 |
| | |
| **අඩුකළා - මුදල් වැය කිරීම්** | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 308,750,001 |
| සහනාධාර සහ මාරුකිරීම් | 6,910,720 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 88,103,174 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - |
| අත්තිකාරම් ගෙවීම් | 12,313,930 |
| තැන්පතු ගෙවීම් | 14,368,102 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන මුදල් ප්‍රවාහය (ආ)** | 430,445,928 |
| | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)-(ආ)** | 8,469,411,328 |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | |
| පොළී | - |
| ලාභාංශ | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - |
| ණය අය කර ගැනීම | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ( ඈ)** | - |
| | |
| **අඩු කළා - මුදල් වැය කිරීම්** | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම් | 8,469,411,328 |
| **ආයෝජන ක්‍රියාකාරම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)** | 8,469,411,328 |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | (8,469,411,328) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)(ඇ)-(ඊ)** | - |

| | |
|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | |

| | |
|---|---|
| දේශීය ණය ගැනිම් | - |
| විදේශීය ණය ගැනීම් | - |
| ප්‍රදානයන් ලැබීම් | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උෟ)** | - |
| | |
| **අඩු කළා - මුදල් වැය කිරීම්** | |
| දේශීය ණය ආපසු ගෙවිම් | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)** | - |
| | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෟ)-(එ)** | - |
| | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - |

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් කේතයේ විස්තරය | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| 2002-01-01 | රජයේ නිවාස හා ගොඩනැගිලි කුලී | 90 | 90 | 88 | 98.49% |
| 2002-02-99 | රජයේ ණය පොළී | 1,500 | 1,500 | 1,425 | 95.03% |
| 2003-02-99 | රජයේ ආදායම | | | | |
| 2004-01-00 | වැ.අ.වි.වැ | 8,840 | 8,840 | 7,680 | 86.89% |

## 3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 624,440 | 549,232 | 418,965 | 76% |
| ප්‍රාග්ධන | 17,202,142 | 17,075,552 | 12,954,802 | 76% |

**3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු.000

| අ. අ | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගිකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | බුද්ධසාසන අමාත්‍යංශය | පාස්කු ඉරුදින ත්‍රස්ථ ප්‍රහාරයේ හානියට පත් දේවාස්ථාන ප්‍රතිසංස්කරණය | 66,000 | 66,000 | 11,716 | 18% |
| 02 | ධීවර අමාත්‍යංශය | හික්කඩුව ධීවර නිවාස සංකීරණය ප්‍රතිසංස්කරණය | 39,012 | 39,012 | 39,012 | 100% |
| 03 | අධ්‍යාපන අමාත්‍යංශය | දෙවන අදියරේ පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම. | 35,844 | 35,844 | 35,844 | 100% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය 31.12.2021 | දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය 31.12.2021 | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | නැත | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 538,760 | 538,760 | - | - |
| 9153 | ඉඩම් | | | නැත | |
| 9154 | Intangible වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 55 න් පසුව ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත.

# පරිච්ඡේදය 4
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම යටතේ දිවියිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකම නව නිවසක් තැනීම යටතේ නිවාස 14022 ක් ඉදිකිරීම.<br>• **ඔබට ගෙයක් රටට හෙටක් වැඩසටහන** - නිවාස 13222 ක වැඩ ආරම්භ කර 3800ක වැඩ අවසන් කර ඇත.<br>• **මිහිඳු නිවහන වැඩසටහන** - නිවාස 1000 ක වැඩ ආරම්භ කර 200ක වැඩ අවසන් කර ඇත. | | ✓ (ඔබට ගෙයක් රටට හෙටක්) | ✓ (මිහිඳු නිවහන) |
| අර්ධ වශයෙන් නිම කල නිවාස සඳහා ණය ආධාර ලබා දීම.<br>රු.මි 1500 ක ඉලක්කයක් යටතේ රු.මි.1545 ක් දක්වා ලගා වී ඇත. | ✓ | | |
| උතුරු නැගෙනහිර ප්‍රදේශ වල අවතැන් වූවන් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන<br>නිවාස 2953 ක වැඩ ආරම්භ කර 2533ක වැඩ අවසන් කර ඇත. | | | ✓ |
| උතුරු නැගෙනහිර සටන් පැවති ප්‍රදේශ වල පුපුරන ද්‍රව්‍ය ඉවත් කර භූමිය නිදහස් කර ගැනීම.<br>ව.කි.මී. 13.5කින් ව.කි.මී 05ක් නිසැක කර ඇත. | | | ✓ |

සැ.යු- අමාත්‍යාංශයට අනුබද්ධිත සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත දර්ශක ඒ ඒ ආයතනය විසින් වෙන වෙනම ඉදිරිපත් කරන කාර්ය සාධන වාර්තා වල ඉදිරිපත් කර ඇත.

# පරිච්ඡේදය 5

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% -74% | 75%100% |
| • රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව විධිවිධාන යටතේ ඉදිකරන ලද නිවාස සංකීර්ණවල ගැනුම්කරුගේ ආදායම මත පදනම් වූ පහසු ගෙවීම් සැලසුම් මගින් අවශ්‍යතා ඇති අයට නිවාස ලබා දීම. | පළාත් 09 තුළ නිවාස සංකීර්ණ 09ක් ඉදිකිරීම. | බස්නාහිර හා සබරගමු පළාත් 02හි නිවාස සංකීර්ණ 02ක් ආරම්භ කර ඇත. | ✓ | | |
| • දිගු කාලීන පහසු ගෙවීම් සැලසුම් මත නාගරික ප්‍රදේශයකින් නිවසක් මිලදී ගැනීමට තරුණ යුවළකට හැකි වන පරිදි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ විශේෂ නිවාස ව්‍යාපෘති දිවයින පුරා ක්‍රියාත්මක කිරීම. | දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාසයකම එක් නිවාස ව්‍යාපෘතියක් ලෙස නිවාස සංකීර්ණ 160ක් ඉදිකිරීම. | දිවුලපිටිය මැතිවරණ කොට්ඨාසයේ රණ්පොකුණුගම සහ අනුරාධපුර දහයියාගම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. | ✓ | | |
| • ගැටුම්කාරි වාතාවරණය හේතුවෙන් අවතැන්ව නැවත පදිංචි කල ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් ඉහල නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | පවුල් 3686 සඳහාම සනීපාරක්ෂක පහසුකම් සැපයීම. | | | ✓ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණය හා අභියෝග සැකෙවින්

තිරසර සංවර්ධන ජාතික සභාවේ උපදෙස් හා මගපෙන්වීම අනුව අමාත්‍යාංශ විෂය පථයට අදාලව තිරසර සංවර්ධන සැලැස්ම 2021 වසර තුල සකස් කර ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

# පරිච්ඡේදය 6
# මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය**

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | | පවතින සේවක සංඛ්‍යාව | | සේවක සංඛ්‍යා හිඟය | |
|---|---|---|---|---|---|---|
| | නිවාස ඉදිකිරීම් අංශය | නැවත පදිංචි කිරීමේ අංශය | නිවාස ඉදිකිරීම් අංශය | නැවත පදිංචි කිරීමේ අංශය | නිවාස ඉදිකිරීම් අංශය | නැවත පදිංචි කිරීමේ අංශය |
| ජ්‍යෙෂ්ඨ | 33 | 18 | 22 | 11 | 11 | 07 |
| තෘතීයික | 06 | 05 | 03 | 01 | 03 | 04 |
| ද්විතියික | 106 | 97 | 79 | 92 | 27 | 05 |
| ප්‍රාථමික | 52 | 27 | 34 | 19 | 18 | 08 |

**6.2** මෙම අමාත්‍යාංශයේ දීප ව්‍යාප්ත සේවාවල ඇතැම් තනතුරු පුරප්පාඩු පැවති අතර ඒ සඳහා පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමට සහ වැඩ බැලීමට නිලධාරීන් පත් කර තිබූ අතර එම තනතුරු ස්ථාවරව පිරවීමේ අවශ්‍යතාවය රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව නිවාස ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය ඇතුළුව පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව මෙසේ ඉදිරිපත් කරමි.

**දීප ව්‍යාප්ත සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටම**

**නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය**

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2021.01.01-2021.12.31) |
|---|---|
| අතිරේක ලේකම් (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය) | 01 |
| අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය) | 02 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී .ලං.ගණකාධිකාරී සේවය) | 01 |
| අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.සැලසුම් සේවය) | 02 |
| අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.පරිපාලන සේවය) | 01 |
| අභ්‍යන්තර විගණක (ශ්‍රී .ලං.ගණකාධිකාරී සේවය) | 01 |
| ගණකාධිකාරී (ශ්‍රී .ලං.ගණකාධිකාරී සේවය) | 01 |
| ඉංජිනේරු (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය) | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී .ලං.පරිපාලන සේවය) | 01 |
| සහකාර ලේකම් (ශ්‍රී .ලං.පරිපාලන සේවය) | 02 |
| සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.පරිපාලන සේවය) | 04 |
| සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය) | 01 |

**තෘතීයික මට්ටම**

### නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2021.01.01-2021.12.31) |
|---|---|
| පරිපාලන නිලධාරී (කළ.සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය) | 01 |
| භාෂා පරිවර්තන සේවය 1 සිංහල - ඉංග්‍රීසි<br>2 සිංහල -දෙමළ | 02<br>01 |
| තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවය | 01 |
| සංඛ්‍යා ලේඛන නිලධාරී | 02 |

### ද්විතීයික මට්ටම

### නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2021.01.01-2021.12.31) |
|---|---|
| සංවර්ධන නිලධාරී සේවය | 13 |
| තාක්ෂණ නිලධාරී සේවය | 03 |
| කළමනාකරණ සහකාර සේවය | 14 |
| ප්‍රමාණ සමීක්ෂක නිලධාරී | 01 |
| ලිපිකරු (නැවත පදිංචි කිරීමේ අංශය) | 01 |

### ප්‍රාථමික මට්ටම

### නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

| සේවය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2021.01.01-2021.12.31) |
|---|---|
| කාර්යාල සේවක සේවය | 14 |
| රියදුරු සේවය | 12 |

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### නිවාස ඉදිකරීම් අංශය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| දෙමළ භාෂා පුහුණුව | 04 | පැය 200 | - | - | දේශීය | දෙමළ භාෂාව ලිවීම, කතාකිරීම, කියවීම. |
| දෙමළ භාෂා පුහුණුව | 01 | පැය 200 | රු.15,000/= | - | දේශීය | දෙමළ භාෂාව ලිවීම, කතාකිරීම, කියවීම. |
| පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | අවුරුදු 01 | රු.196,000/= | - | දේශීය | ගණකාධිකාරී සේවයට වැඩිදුරටත් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම. |
| ධනාත්මක මනෝවිද්‍යාව හා ආතති කළමනාකරණය | 01 | දින 02 | රු.7,000/= | - | දේශීය | ආතති කළමනාකරණය කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Presentation Skills | 20 | දින 02 | රු.180,000/= | - | දේශීය | තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් කාලය කළමනාකරණය කරගනිමින් සිත්ගන්නා ආකාරයෙන් වැඩසටහනක් ඉදිරිපත් කිරීම. |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම. | 02 | දින 01 | රු.10,000/= | - | දේශීය | ගිණුම් අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම. |
| පෞද්ගලික ලිපිගොණු පවත්වාගෙන යාම. | 01 | දින 01 | රු.4,000/= | - | දේශීය | පෞද්ගලික ලිපිගොණුවක් නිවැරදිව පවත්වාගෙන යාමට හැකිවීම. |
| අභ්‍යන්තර විගණනය සහතික පත්‍ර පාඨමාලාව. | 01 | දින 10 | රු.20,000/= | - | දේශීය | අභ්‍යන්තර විගණන අංශයේ විගණන කටයුතු නිවැරදිව සිදුකිරීම. |
| ආයතන සංග්‍රහය හා විනය කාර්ය පටිපාටිය. | 18 | පැය 3 1/2 | | - | දේශීය | ආයතන සංග්‍රහය හා විනය කාර්ය පටිපාටිය පිළිබඳ මූලික දැනුම ලබාගැනීම. |
| කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි | 02 | දින 02 | රු.16,000/= | - | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය |
| Seminar on Building Smart Cities Under BRI (Online) | 01 | | - | - | විදේශීය (Online) | |
| Seminar on Urban Governance Emerging Cities Developing Countries. | 01 | | - | - | විදේශීය (Online) | |
| Mixed Development Sharing Success Stories and best Practices – Malaysian tech – Cooperation (Online) | 01 | දින 05 | - | - | විදේශීය (Online) | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Seminar on Building and Management of Industrial Parks for Developing Countries. (Online) | 02 | දින 14 | - | - | විදේශීය (Online) | |

**නැවත පදිංචි කිරීමේ අංශය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම | 01 | | රු.150,000/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා ගිවිසුම් පරිපාලනය | 01 | | රු.100,000/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධ පාඨමාලාව | 51 | පැය.10.00 | රු.30,360/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| කළමනාකරණය හා ආයතන සංග්‍රහය | 04 | පැය 7.00 8000 * 4 | රු.32,000/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදනය. | 04 | පැය 7.00 8000 * 4 | රු.32,000/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| කාර්යාල කාර්ය සේවය. | 01 | පැය 7.00 | රු.8,000/= | - | දේශීය | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |
| රියදුරන් සඳහා පාඨමාලාව | 01 | පැය 7.00 | රු.8,000/= | - | | සාර්ථකව සම්පූර්ණ කර ඇත. |

**අයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- අමාත්‍යාංශයේ නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා යොමු කරනු ලබන්නේ ඔවුන්ගේ රාජකාරි ස්වභාවය සහ අදාල වන විෂය ක්ෂේත්‍රය අනුව වන බැවින් එකී විෂය පිළිබඳ මනා දැනුමක් පුහුණුවෙන් පසු නිලධාරියා ලබාගන්නා බැවින් රාජකාරිමය කටයුතු ඉටු කිරීමේදී පහසු වේ.

- තවද ඇතැම් පුහුණු පාඨමාලා තුලින් ලබාගන්නා දැනුම රාජ්‍ය සේවයේ විශ්‍රාම ලබා ගන්නා තෙක් රාජකාරි ඉටු කිරීමට වැදගත් වේ.

# පරිච්ඡේදය 7
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම්** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදී බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරී පාලනය යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| **7**.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පැවැත්වීම. | කොරෝනා වසංගතය නිසා රැස්වීම් 04ක් පැවැත්වීමට නොහැකි වීම. |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්චේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | අනුකූල නොවේ | 2021.04.23 අනුබද්ධිත ආයතන වලින් සම්බන්ධීකරණ නිලධාරීන් පත් කර එම | |

| | | | | |
|---|---|---|---|---|
| | | | තොරතුරු එවන ලෙස ලිපියක් යෙමු කර ඇත.2021.12.07 වන විටත් තොරතුරු ලැබී නැති බැවින් සිහිකැඳවීම් යවා ඇත. | |
| | සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම | අනුකූල නොවේ | COVID 19 හේතුවෙන් මහජන ඒකරාශී වීම් වලට අවසර නොලැබුනු නිසා භාණ්ඩ වෙන්දේසිය 2022 වසර දක්වා කල් තබා ඇත. | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම<br>(නිවාස හා ඉදිකිරීම් අංශය) | අනුකූල වේ | | |
| | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම<br>(නැවත පදිංචි කිරීමේ අංශය) | අනුකූල වේ | | කොවිඩ් -19 වසංගත සංචරන සිමා හේතුවෙන් අපහරණ කටයුතු තරමක් ප්‍රමාද වු අතර,මේ වන විට අපහරණ කටයුතු සිදු කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවති |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම | අනුකූල වේ | | |
| 10. 3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූලවීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | නැවත පදිංචි කිරීමේ අංශයේ වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගේ ණය ශේෂය අය නොවී පවතී. | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නොවේ | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.1 | අනුමත තාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසියන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම්කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |